# බළන්ගොඩ නගර සභාව

## 2020-09-15 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2020.09.15**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14.ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභාවේ සභා වාර්තාව හා විශේෂ මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2020-07-08 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව හා 2020-08-18 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් 2020-07-08 දින පැවති විශේෂ මහ සභාවේ සභා වාර්තාව හා 2020-08-18 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රි එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින මහ සභාවේ සංශෝධන කිසිවක් නොතිබුණි.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තා සභා සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- සභාවේ සියළු දෙනාම දැන උගත් බුද්ධිමත් සභිකයින් ලෙස සභාව සඳහා ඇහුම්කන් දී දුරකථන ක්‍රියා විරහිත කරගනිමින් සභාව සඳහා අවධානය යොමුකරන ලෙස පවසන ලදී.
- 2021 වර්ෂයේ අයවැය සකස් කිරීම සඳහා ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා හා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/ මන්ත්‍රීතුමියන්ලාගෙන් යෝජනා 2020-06-18 දින ලිපිය මගින් 2020-07-14 දිනට පෙර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති නමුත් මේ වන විට ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙකු හැර අනෙකුත් මන්ත්‍රීතුමන්ලා තම කොට්ඨාශ වලට අදාළ යෝජනා ලබා දී නොමැති බැවින් තම කොට්ඨාශවලට අදාළ යෝජනා හා ආදායම් උත්පාදනය කර ගැනීමේ යෝජනා 2020-09-30 දිනට පෙර ලබාදෙන ලෙස පවසා සිටින ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම.**

- බළන්ගොඩ ඇල්ලෙපොල සරස්වතී මාර්ගයේ ජළ නල ඉතා අඩු ගැඹුරකින් එළා ඇති අතර කාපට් යොදා සංවර්ධනය කළ පසු ජල කාන්දුවක් සිදු වුවහොත් මාර්ග නලය පළුදු වන අතර නළයේ විශ්කම්භය ද (2”) ප්‍රමාණවත් නොවන බැවින් කිලෝ මීටර් 03 ක් දුරට පී.වී.සී.නළ ජල සම්පාදන මණ්ඩලය මගින් ලබා දෙන අතර නළ එළීම සඳහා සභාවේ අවසරය සමඟ සභාවට

අයත් ජේ.සී.බී.යන්ත්‍රය ලබා දීමට කටයුතු කරන මෙන් බළන්ගොඩ ජල සම්පාදන ක්‍රමය මගින් ඉල්ලා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

**නියමිත රාජකාරියෙන් ඔබ්බට ගොස් තම නිර්මාණශීලී හැකියාව ආයතනය වෙත දායාද කරමින් වාහන යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාව හා නඩත්තු කිරීම හා අනෙකුත් අංශයන්හි විවිධ අඩුපාඩු සකස් කරමින් ඒ වෙනුවෙන් වැය කරන අධික පිරිවැය අවම මට්ටමකට පත්කිරීම උදෙසා දක්වන ලද දායකත්වය උනන්දුව, විශිෂ්ඨ කැපවීම හා ඉටු කරන ලද සුවිශේෂී කාර්යභාරය ප්‍රශංසනීයව අගය කිරීම උදෙසා චමිල ක්‍රිෂාන්ත මහතාට හා සුදන්ත ප්‍රේමලාල් මහතාට ප්‍රශංසා සහතික පිරිනමන ලදී.**

04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම.

මෙදිනට අදාළ ටෙන්ඩර් පත් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කර ගන්නා ලදී.

**04.01** පොදු වෙළෙඳසැල අංක 07 කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා කැඳවන ලද ලංසුපත් විවෘත කිරීම.

පොදු වෙළෙඳසැල අංක 07 කඩ කාමරය සඳහා එක් ලංසුපතක් නිකුත් කර තිබූ අතර එම ලංසුපත ලැබී තිබුණි. එහි ලංසු මුදල ලෙස රු.3,010.00 ක මුදලක් අංක 14/සී, තානායම් පිවිසුම් පාර, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි අමිතා චාන්දනී නිලවීර මහත්මිය විසින් දක්වා තිබූ අතර එම ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**04.02** කුණු කසල එකතු කිරීම, ඉවත් කිරීම හා පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීම සඳහා කැඳවන ලද ලංසුපත් විවෘත කිරීම.

කුණු කසල එකතු කිරීම, ඉවත් කිරීම ටෙන්ඩර් කිරීම හා පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීම සඳහා ලංසුපත් දෙක බැගින් නිකුත් කර තිබූ අතර එම ලංසුපත් සියල්ල ලැබී තිබුණි. මෙම ලංසුපත් අතරින් කුණු කසල එකතු කිරීම, ඉවත් කිරීම සඳහා අවම ලංසු මුදල ලෙස රු.720,000.00 ක මුදලක් ද පොදු වැසිකිළි සඳහා වැඩිම ලංසු මුදල ලෙස රු.71,000.00 ක මුදලක් ද ඉදිරිපත් කර තිබූ යූ.ආර්.ටී.එන්.ඩී.රණසිංහ යන අය වෙත ඉහත සඳහන් ටෙන්ඩර් දෙක ලබා දීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. නමුත් මෙහිදී අනෙක් ලංසුපත ඉදිරිපත් කර තිබූ කාල්ඩීන් චාලට් යන විසින් මෙම ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණයට විරෝධතාවය පළකරන ලදී. ඇය පවසා සිටින ලද්දේ මෙම ලංසුපත් ඉදිරිපත් කර ඇති යූ.ආර්.ටී.එන්.ඩී.රණසිංහ යන අය නගර සභාවේ සේවයේ නියුතු යු.ආර්.පියදාස මහතාගේ දරුවා බවත් ඒ අනුව ඔහු ලංසු ඉල්ලුම්පත්‍ර වල කොන්දේසි උල්ලංඝනය කර ඇති බවත්ය. මේ පිළිබඳව සාකච්ඡා කරන ලද

ටෙන්ඩර් මණ්ඩලය විසින් යූ.ආර්.ටී.එන්.ඩී.රණසිංහ යන අය ටෙන්ඩර් කොන්දේසි උල්ලංඝනය කර ඇති බව තීරණය කරන ලදී. එබැවින් කාල්ඩීන් චාලට් යන අය විසින් කුණු කසල එකතු කිරීම, ඉවත් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලංසු මුදල සභාවේ අවම ලංසු මුදල ඉක්මවා ඇති බැවින් ඇයටද මෙම ටෙන්ඩරය ලබා දිය නොහැකි විය. එබැවින් කුණු කසල එකතු කිරීම, ඉවත් කිරීම සඳහා නැවත ටෙන්ඩර්පත් කැඳවීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. එමෙන්ම පොදු වැසිකිළි ටෙන්ඩරය රු.70100.00 ක ලංසු මුදලක් ඉදිරිපත් කර තිබූ කාල්ඩීන් චාලට් යන අය වෙත ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

**04.03** සභාව සතු වාහන සඳහා අවශ්‍ය 195X15 ප්‍රමාණයේ ටයර් 04 ක් හා 700X16 ප්‍රමාණයේ ටයර් 06 මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

සභාව සතු වාහන සඳහා අවශ්‍ය 195X15 ප්‍රමාණයේ ටයර් 04 ක් හා 700X16 ප්‍රමාණයේ ටයර් 06 මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව ආයතන දෙකකින් මිළ ගණන් ලැබී තිබුණි. ඒ අනුව 195X15 ප්‍රමාණයේ ටයර් සඳහා කල් පැවැත්මට හා භාවිතයට සුදුසු ඉන්දුනීසියාවේ නිෂ්පාදිත GT 8 PR වර්ගයේ ටයර් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති පෙරේරා ටයර් සර්විස් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් 195X15 ප්‍රමාණයේ ටයර් එකක් රු.18,518.52 බැගින් ටයර් 04 ක් මිළදී ගැනීමටත්, CEAT 12PR වර්ගයේ 700X16 ප්‍රමාණයේ ටයර් එකක් රු.15350.00 බැගින් ටයර් 06ක් අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ක්‍රවුන් ටයර් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් මිළදී ගැනීමට තීරණය කරන ලදී.

**04.04** සභාව සතු වාහනවල ටයර් නැවත පිරවීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

සභාව සතු වාහනවල ටයර් නැවත පිරවීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව ආයතන දෙකකින් මිළ ගණන් ඉදිරිපත් කර තිබුණි. එහිදී සමස්ථයක් ලෙස අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ක්‍රවුන් යටර් සර්විස් ආයතනයේ මිළ ගණන් පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

| ටයර් වර්ගය | මිළ ගණන |
|---|---|
| 600X16 | රු.4,300.00 |
| 700X16 | රු.4,950.00 |
| 750X16 | රු.5,500.00 |
| 700X15 | රු.4,800.00 |
| 650X16 | රු.4,600.00 |
| 12.4X28 | රු.14,300.00 |
| 12.5x18/80 | රු.15500.00 |

**04.05** වීථි පහන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

වීථි පහන් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් මිළ ගණන් සළකා බලා මිළදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

**04.06** ජල උපාංග මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් විවෘත කිරීම.

ජල උපාංග මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් මිළ ගණන් සළකා බලා මිළදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ඉහත ටෙන්ඩර් මණ්ඩල තීරණ ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

05. කල් දී ඇති ප්‍රශ්න

**05.01 ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

05.01.01 2019.06.11 දින මහ සභාවේ යෝජනා වූ පරිදි පෙර පාසල් ගුරුවරු බඳවා ගැනීම සම්බන්ධයෙන් වර්තමාන ප්‍රගතිය කුමක්ද?

මෙහිදී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, 2019.06.11 දින සභාවේ යෝජනා වූ පරිදි පෙර පාසල් පාලිකා තනතුරේ බඳවා ගැනීම සම්බන්ධ ලිපිය 2019-07-05 දින පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කළ පසු ඒ සම්බන්ධයෙන් නිරන්තරයෙන් විෂය භාර නිළධාරීන් හා ප්‍රජා සංවර්ධන නිළධාරි මහතා දැනුවත් කළ බවත් එහිදී අදහස වූයේ සබරගමුව පළාත් සභාවේ පෙර පාසල් පාලිකා තනතුර සඳහා බඳවා ගැනිමට විධිමත් වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය යන්නත් පවසන ලදී.

නමුත් පෙර පාසලේ පවතින අවශ්‍යතාවය මත 2020-06-16 දින නැවත ඇමුණුම් සහිතව ආවරණ ලිපියක් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අතර එම ලිපිය පළාත් පාලන කොමසාරිස් විසින් 2020-08-10 දින ප්‍රධාන අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව ද මේ අතර කාලය තුළදී පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය හා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විෂය භාර නිළධාරීන් දැනුවත් කරන ලද බවද පවසන ලදී.

එහිදී ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් කාර්යාලය පැවසූයේ ජනාධිපතිවරණය, මහ මැතිවරණය ආදී කටයුතු නිසා මෙය කල් ගිය අතර, මුදල් කොමිෂන් සභා ලේකම්ගේ FC/RCA/06/01/GEN/2021/VO/I හා 2020-08-11 දිනැති "පළාත් පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම - 2021 පළාත් කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම හා නව බඳවා ගැනීම්" ලිපියට අනුව පුරප්පාඩු පිරවීමෙන් වළකින ලෙස දන්වා ඇති බැවින් මෙම ලිපිය සම්බන්ධයෙන් කටයුතු කළ නොහැකි බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, සභා තීන්දුවක් ලබා ගෙන මෙම පෙර පාසල් ගුරුවරිය සඳහා රු.10,000.00ක දීමනාවක් ගෙවිය නොහැකිදැයි විමසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ එසේ තීන්දුවක් ලබා ගතහොත් පළාත් සභාව වෙත යවා අනුමැතිය ලබා ගත යුතු බවයි. එනමුත් දැනට පෙර පාසල් පාලිකා තනතුරෙහි සේවයේ යෙදී සිටින ගුරුවරුන් සඳහා රු.5,000.00 ක් වැඩි කරන ලෙස ලිපි මීට පෙර යොමු කර ඇතත් ඒ සඳහාද මේ වන විට පිළිතුරක් ලැබී නොමැති බව වැඩිදුරටත් පවසන ලදී.

05.01.02 කුණු කසළ එකතු කිරීමේදී අතුරු මාර්ගවලට ගමන් කිරීමට ලබා දෙනු ලබන මහේන්ද්‍රා බොලේරෝ යන්ත්‍රයේ වර්තමාන තත්ත්වය කෙසේද?

ඉහත ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා, මෙම සභාවට ලබා ගැනීමට නියමිත මිනි ට්‍රක් රථය ලබා ගැනීම සඳහා ACLG/04/08 හා 2020-01-28 දිනැති පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ ලිපිය මගින් රාජ්‍ය ආයතන සඳහා මෝටර් වාහන ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ලිපියක් නිකුත් කර ඇති අතර එම ලිපියට අදාළව මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාශයේ අංක BD/CBP/01/01/03-2019 හා 2019-12-04 අයවැය චක්‍රලේඛ 07/2019 ට අදාළව වාහනය මිළදී ගැනීම සඳහා අමාත්‍යාංශ අනුමැතියට එම ලිපිය යොමු කර ඇති බව පවසන ලදී.

නමුත් මේ දක්වා අමාත්‍යාංශ අනුමැතිය ඒ සඳහා ලැබී නොමැති අතර එම ලිපිය ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති බව වැඩිදුරටත් පවසන ලදී.

06. කල් දී ඇති යෝජනා

**06៖01 ගරු සභාපති චමික ජයමිණී විමලසේන මැතිතුමා**

06.01.01 තානායමේ අත්‍යවශ්‍ය වශයෙන් අළුත්වැඩියා කළ යුතු කොටස් අළුත්වැඩියා කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, පළාත් විදුලි ඉංජිනේරුතුමා සමඟ තානායමේ පවතින ජෙනරේටරය පරීක්ෂාවට ගිය අවස්ථාවේදී බළන්ගොඩ තානායම අලුත්වැඩියා කළ යුතු බව තමන් දුටු බව ද මෙය සභාවට ආදායමක් ලැබෙන ආයතනයක් බැවින් ඉදිරියේදී ටෙන්ඩර් කිරීමට වුවද එය යථා තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා පවසා සිටියේ බළන්ගොඩ තානායම් පාර දෙවන වර තාර දැමීම සිදු කරන ලෙසය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.02 ගරු නාගරික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ (නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා) සමිති සහ ආගමික ස්ථාන වලට ලබාදීම සඳහා ශබ්ද විකාශන කට්ටල (බෆල්) 10 ක් හා ඇඳි සහිත ප්ලාස්ටික් පුටු 340 ක් මිළදී ගැනීමට කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන පහත සඳහන් පරිදි අනුමත කර ගැනීම.

- ප්ලාස්ටික් පුටු ඇඳි සහිත - රු.1,375.00 (ඒකක මිළ) - සෙනෙවිරත්න ට්‍රේඩ් සෙන්ටර්
- ශබ්ද විකාශන යන්ත්‍ර - රු.33,000.00(ඒකක මිළ) -සෙනෙවිරත්න ට්‍රේඩ් සෙන්ටර්

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.03 ගරු නාගරික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ (එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය) සමිති සහ ආගමික ස්ථාන වලට ලබාදීම සඳහා වානේ අල්මාරියක් හා කැලි 07 බුෆේ කට්ටලයක් (සිල්වර්) මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන පහත සඳහන් පරිදි අනුමත කර ගැනීම.

- වානේ අල්මාරි එකක් - රු.13,900.00 - චතුර ෆර්නිචර්ස්
- කැලි 07 බුෆේ කට්ටලයක් (සිල්වර්/ උපාංග සහිත) - රු.40,500.00 -ජස්මින් ඇලුමිනියම්

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.04 ගරු නාගරික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ (ලාල් ගලප්පත්ති මැතිතුමා) සමිති සහ ආගමික ස්ථාන වලට ලබාදීම සඳහා ඇඳි රහිත ප්ලාස්ටික් පුටු 180 ක් සහ කැනපි හට් 01 ක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ආයතන පහත සඳහන් පරිදි අනුමත කර ගැනීම.

- ඇඳි රහිත ප්ලාස්ටික් පුටු - රු.915.00 (ඒකක මිළ) - චතුර ෆනිචර්ස්
- කැනපි හට් 01 - රු.46,900.00 - හංසි ඉන්ඩස්ට්‍රීස්

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.05 නගර සභා පෙර පාසල් දරුවන්ගේ ආගමික වතාවත් ඉටු කිරීම සඳහා බුදු පිළිමයක් (ෆයිබර්) සහ තීන්ත ආලේපිත ටයිල් මතුපිට සහිත ආධාරකයක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති විකිළිය කොන්ක්‍රීට් ආයතනයේ රු.11,300.00 ක අවම මිළ ගණන අනුමත කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.06 තුරු උයන සඳහා ඇඳි සහිත කොන්ක්‍රීට් බංකු (කලු පැහැති) 06ක් සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන ඉදිරිපත් කර තිබූ විකිළිය කොන්ක්‍රීට් වර්ක්ස් ආයතනයේ රු.7,800.00 (එකක මිළ) මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.07 පුස්තකාලය සඳහා 1ʹ සනකමින් යුතු පොත් රාක්ක (6X4 ප්‍රමාණයේ) හතරක් සකස් කර නිම කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන ඉදිරිපත් කර තිබූ නිහාල් ෆර්නිචර්ස් - මොරහැල ආයතනයේ රු.27,500.00 (එකක මිළ) මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.08 ගිණුම් අංශය සඳහා මධ්‍යම ප්‍රමාණයේ පුටු 02 ක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන ඉදිරිපත් කර තිබූ සෙනෙවිරත්න ට්‍රේඩ් සෙන්ටර් ආයතනයේ රු.11,650.00 (එකක මිළ) මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.09 ගබඩා අවශ්‍යතා සඳහා ලේඛන හා ආකෘති මුද්‍රණය කර ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන පහත සඳහන් පරිදි අනුමත කර ගැනීම.

| වර්ගය | ඒකක මිළ රු. | ආයතනය |
|---|---|---|
| පොළ පොත් -ලදුපත් 04 පිටපත් 02 ක් සහිත | 275.00 | කරුණාරත්න ප්‍රින්ටර්ස් |
| වවුචර් - ලීගල් ප්‍රමාණය දෙපැත්ත | 4.50 | සීගිරි ප්‍රින්ටර්ස් |
| සෞඛ්‍ය අංශයේ රිසිට් පොත් පිටපත් 03 ක් සහිත | 250.00 | සීගිරි ප්‍රින්ටර්ස් |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.10 පුස්තකාලයේ Smart Library සඳහා අවශ්‍ය ඇලුමිනියම් වීදුරු හා පැඩින් දොර ජනේල් සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන ඉදිරිපත් කර තිබූ නිර්මාණි ඇලුමිනියම් ආයතනයේ මිළ ගණන් පහත සඳහන් පරිදි අනුමත කිරීම.

- දොර - රු.32,600.00
- ජනේලය - රු.17,500.00

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.11 පුස්තකාලයේ ළමා අංශයේ ප්‍රධාන දොර Sliding ක්‍රමයට සකස් කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන ඉදිරිපත් කර තිබූ නිර්මාණි ඇලුමිනියම් ආයතනයේ රු.66,000.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.12 පුස්තකාල වැසිකිළි දොරවල් දෙකක් හා උළුවහු සාදා සවි කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන ඉදිරිපත් කර තිබූ නිර්මාණි ඇලුමිනියම් ආයතනයේ රු.25,000.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.13 බුලත්ගම සුසාන භූමිය වැසිකිළිය දොරවල් හා උළුවහු (අගුලු සහිතව ) සාදා සවි කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන ඉදිරිපත් කර තිබූ නිර්මාණි ඇලුමිනියම් ආයතනයේ රු.14,000.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.14 පුස්තකාල නාම පුවරුව සකස් කිරීම සඳහා රු.200,000.00 මුදලක් අනුමත කර ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, පුස්තකාලය ඉදිරිපිට මාර්ගය දෙපසින්ම පැමිණෙන ජනතාවට පෙනෙන සේ පුස්තකාල නාම පුවරු දෙකක් අවශ්‍ය බව පුස්තකාලය විසින් පැවසූ බව ද මේ වන විට පුස්තකාලය සඳහා නාම පුවරුවක් නොමැති බවද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, පුස්තකාල බැම්මේ නගර සභා නාම පුවරුව සවි කර ඇති බැවින් එම පුවරුව උස්සා සකස් කර ඊට පහළින් පුස්තකාල බැම්මේ පුස්තකාල නාම පුවරුව සවි කරන ලෙස පවසන ලදී.

පුස්තකාල නාම පුවරුව සභාවේ නාම පුවරුව අභිබවා යාම අවශ්‍ය නොවන බැවින් එක නාම පුවරුවේ දෙපැත්තෙහි නම ගසා පුවරුව සකස් කිරීම සුදුසු බවද මේ සඳහා කුමන හෝ ආයතනයකින් අනුග්‍රහයක් ලබා ඉටු කිරීම සුදුසු බවද සභාවේ මතය විය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.15 නගර සභා පෙරපාසලේ එළිමහන් ක්‍රියාකාරකම් ස්ථානය (නිර්මාණාත්මක කොන්ක්‍රීට් මේස 05ක් බංකු 60 ක් සහිත ) ඉදිකිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන ඉදිරිපත් කර තිබූ සංකල්පා ආයතනයේ රු.163,000.00 ක මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.16 කාර්යාලීය ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව පහත සඳහන් පරිදි අවම මිළ ගණන සඳහා අනුමැතිය ලබා ගැනීම.

**ජෝති ස්ටෝර්ස්**

| *වර්ගය* | *ඒකක මිළ රු.* |
|---|---|
| CT 500 කැල්කියුලේටර් | 1600.00 |
| දෙපියන් ෆයිල් | 70.00 |
| පෝස්ට් ඉට් පැකට් | 75.00 |
| නෝමල් ෆයිල් | 4.70 |
| මිනි සබන් 24 පැකට් | 280.00 |
| 9X4 ලියුම් කවර | 1.75 |
| පොඩි ලියුම් කවර | 0.95 |
| පැන්සල් | 16.00 |
| හයිලයිට් පෑන් | 115.00 |
| වයිට් බෝඩ් මාකර් | 80.00 |
| ටිපෙක්ස් | 72.50 |
| CR I | 48.00 |
| CR II | 82.50 |
| CR III | 120.00 |
| CR IV | 150.00 |
| Ink pad | 150.00 |
| ඉබි යතුරු (ලොකු) | 925.00 |
| ඉබි යතුරු (මධ්‍යම) | 375.00 |
| පොඩි බැටරි | 40.00 |
| ලොකු බැටරි | 100.00 |
| කතුරු(කුඩා) | 45.00 |
| A4 රතු බන්. | 1275.00 |
| A3 බන්. | 1450.00 |
| ලීගල් | 950.00 |
| ෆයිල් යවන ලියුම් කවර | 10.00 |
| විම් සබන් | 25.00 |

| | |
|---|---|
| Computer Sheet A4 Size Copy 04 | 6100.00 |
| Computer Sheet A4 Size Copy 02 | 4200.00 |
| Computer Sheet A4 Size Copy 01 | 2450.00 |

**නිව් ජෝති ස්ටෝර්ස්**

| වර්ගය | ඒකක මිළ රු. |
|---|---|
| පොඩි ලියුම් කවර | 0.95 |
| පැන්සල් | 16.00 |
| CR III | 120.00 |
| Field Note Book | 45.00 |
| හාෆ්ෂීට් බන්ඩල් | 525.00 |
| විම් සබන් | 25.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.17 මහජන පොළ පොදු වැසිකිළියට ජලය ලබා ගැනීමට අවශ්‍ය ජල මෝටරයක් ලබා ගැනීම සඳහා කැළණි ඒජන්සීස් වෙතින් ඉදිරිපත් කර ඇති රු.19,000.00 ක මිළ ගණන සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.18 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය ටෝනර් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් පහත සඳහන් පරිදි අනුමත කිරීම.

- MP - 214 HS Toner එකක් රු.7000.00 බැගින් ටොනර් දෙකක් මිළදී ගැනීම සඳහා Gestetner of Ceylon Plc ආයතනයෙන් ඉදිරිපත් කර ඇති අවම මිළ ගණන අනුමත කිරීම.
- LQ 300 Epson Toner එකක් රු.890.00 බැගින් ටෝනර් 10 ක් මිළදී ගැනීම සඳහා Pc Systems වෙතින් ඉදිරිපත් කර ඇති අවම මිළ ගණන අනුමත කිරීම.

- 85A Toner එකක් රු.2250.00 බැගින් ටෝනර් 15 ක් මිළදී ගැනීම සඳහා Wisdom Computer Technologies වෙතින් ඉදිරිපත් කර ඇති අවම මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.19 56-1906 කැබ් රථයේ පහත සඳහන් අමතර කොටස් යොදා අළුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ක්ලච් ප්ලේට්
- ප්‍රෙෂර් ප්ලේට්
- ක්ලච් රේසර්
- ප්‍රයිවිල් රේසර්

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.20 QL - 2901 ත්‍රීරෝද රථයේ පහත දෑ අළුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ඉදිරිපස අසුන අලුතින් සෑදීම.
- පිටුපස අසුන අළුත්වැඩියා කිරීම.
- ඉදිරිපස හා පිටුපස සංඥා ලාම්පු අළුතින් දැමීම.
- ඉදිරිපස බීඩින් සහ වීදුරු රාමු අළුතින් දැමීම.
- පිටුපස අපොස්ටින් දෙක අළුතින් දැමීම.
- දැනට පවතින වින්ඩ්ස්ක්‍රීන් එක භාවිතයට අපහසු බැවින් එය තනි වීදුරුව සහිත වින්ඩ්ස්ක්‍රීන් එකකට මාරු කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.21 VI-1833 යතුරුපැදිය හා JD-4684 යතුරුපැදියේ එන්ජිම අළුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ එකමතිකව සම්මත විය.**

06.01.22 බොබ් කැට් යන්ත්‍රය පූර්ණ සේවාවේදී C –Com Equipment ආයතනය විසින් පෙන්වා දුන් පහත අළුත්වැඩියා සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සහ ඒ සඳහා වන මිළ ගණන් පහත සඳහන් පරිදි අනුමත කර එය ඉටු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| Description | Unit | Qty | Unit Price | Total Rs. |
|---|---|---|---|---|
| Travelling Lever Seal | Nos | 02 | 3,990.00 | 7,980.00 |
| Travelling Motor O ring | Nos | 02 | 1,110.00 | 2,200.00 |
| Tilt Cylinder Bush | Nos | 01 | 8,023.00 | 8,023.00 |
| Tilt Cylinder Pin | Nos | 01 | 15,790.00 | 15,790.00 |
| Accelerator Seal | Nos | 01 | 1,100.00 | 1,100.00 |
| Paddle Bush | Nos | 02 | 2,440.00 | 4,880.00 |
| Crank Seal | Nos | 02 | 8,600.00 | 17,200.00 |
| Fuel Sole Noid | Nos | 01 | 52,760.00 | 52,760.00 |
| Grease Nipples | Nos | 06 | 575.00 | 3,750.00 |
| Main Pump Seal | Nos | 01 | 8,600.00 | 8,600.00 |
| Lifting Jack T-Union | Nos | 01 | 1,100.00 | 1100.00 |
| Lifting Jack Hose | Nos | 04 | 2,600.00 | 10400.00 |

Technical Charges & Other

Technical Charges for the engine Removed & Crank seal replaced – Rs.13900.00

Technical charges for the Main Pump Seal replaced – Rs. 6800.00

Technical Charges for the Other repaired – Rs.11400.00

Sundries – Rs. 3200.00

Ttansport Charges – Rs.22500.00

VAT 8% - Rs.15302.64

Total Amount – Rs.206,585.64

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.23 QL - 2901 ත්‍රිරෝද රථයේ ඉදිරිපස තට්ටුව හා පිටුපස බක්කියෙහි ඇති දිරුම් සම්පූර්ණයෙන් ඉවත් කර ටින්කරින් හා පේන්ට් කිරීම, ටෙන්ට් එක අළුතින් ගැසීම යන අළුත්වැඩියා සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර තිබූ චමින්ද මෝටර්ස් ආයතනයේ රු.107,000.00 අවම මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.24 226-7521 ටිපර් රථයේ පිටුපස දොරවල් දෙක අලුතින් සාදා වාහනය සම්පූර්ණයෙන් පින්තාරු කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව මිළ ගණන් ඉදිරිපත් කර තිබූ පී.එම්.කේ.හාඩ්වෙයාර්හි රු.63,765.00ක අවම මිළ ගණන් අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | අවශ්‍ය ප්‍රමාණය | ඒකක මිළ | තොගයේ මිළ |
|---|---|---|---|
| තහඩු (මිලී මීටර් 02) | 2 | 12,500.00 | 25,000.00 |
| සුදු තීන්ත ලීටර් 2 | 2 | 1,190.00 | 2,380.00 |
| කළු තීන්ත ලීටර් | 3 | 1,190.00 | 3,570.00 |
| ටිනර් ලීටර් | 6 | 430.00 | 2,580.00 |
| 60 වැලි කොළ | 10 | 90.00 | 900.00 |
| 40 වැලි කොළ | 10 | 90.00 | 900.00 |
| 80 වැලි කොළ | 10 | 90.00 | 900.00 |
| කටින් වීල් පැකට් | 01 | 110.00 | 2,750.00 |
| 10 වැල්ඩින් කුරු | 01 | 2,375.00 | 2,375.00 |

| | | | |
|---|---|---|---|
| 12 වැල්ඩින් කූරු | 01 | 690.00 | 690.00 |
| ඉදිරිපස දොර පින් | 02 | 750.00 | 1,500.00 |
| පිලර් ලීටර් | 02 | 1,100.00 | 2,200.00 |
| පොට් ලීටර් | 01 | 1,120.00 | 2,240.00 |
| කැටිලො ලීටර් | 04 | 3,930.00 | 3,930.00 |
| 2X2 එල්ලයරින් | 03 | 3,950.00 | 11,850.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.25 LL-7688 කෘෘ කැබ් රථයේ ක්ලච් පද්ධතිය අලුත්වැඩියා කිරීමට අවශ්‍ය පහත සඳහන් අමතර කොටස් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව මිළ ගණන් ලැබී ඇති ඉන්ද්‍රා මෝටර්ස් ආයතනයේ රු.37,100.00 මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් අමතර කොටස් මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| Description | Qty | Amount |
|---|---|---|
| Clutch Plate | 01 | 9,850.00 |
| Pressure Plate | 01 | 14,500.00 |
| Clutch Release Bearing | 01 | 4,950.00 |
| Rear Door Glass –LH | 01 | 7,800.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.26 කාර්යාලීය ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| වවුචර් | 1000 |
| මිළ ගණන් කැඳවීමේ කොළ | 2000 |
| සෞඛ්‍ය අංශයේ රිසිට් පොත් | 200 |
| හාපික් | 100 |

| | |
|---|---|
| පැමිණීමේ ලේඛන | 10 |
| ප්‍රසම්පාදන පොත් | 15 |
| කම්කරු චෙක් රෝල් කොළ | 1500 |
| ෆයිනෝල් | 10 |
| නිකුත් කිරීමේ නියෝග පොත් | 50 |
| ඉන්ධන නිකුත් කිරීමේ පොත් | 50 |
| ගාබේජ් බෑග් | 1000 |
| පොඩි බොක්ස් හෝල්ඩර් | 100 |
| ලොකු බොක්ස් හෝල්ඩර් | 75 |
| පාට ගම් ටේප් | 100 |
| ඉදල් | 100 |
| සභා වාර්තා අලවන පොත් | 10 |
| ධාවන සටහන් පොත් | 25 |
| වැය ලේඛන | 10 |
| බලපත්‍ර ගාස්තු ලේඛන | 10 |
| Computer Sheet A5 4ply | 10 |
| නිවාඩු කොළ | 1000 |
| අතිකාල කොළ | 1000 |
| ගමන් වියදම් කොළ | 1000 |
| ඉන්ධන අයදුම්පත් | 1000 |
| දෙපියන් ෆයිල් | 200 |
| පාට A4 | 500 |
| බෝල්පොයින්ට් පෑන් | 1000 |
| ෆයිල් ටැග් | 1000 |
| කැල්කියුලේටර් | 05 |
| සේවක ණය ලේඛන | 05 |
| වරිපනම් හා බදු කුලී ලේඛන | 10 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ එකමතිකව සම්මත විය.**

06.01.27 පුස්තකාලය පොත් බැඳීම සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය |
|---|---|
| ලෙදර් ෂීට් | 200 |

| | |
|---|---|
| කෙම්ෆික්ස් ගම් ලීටර් 04 | 10 |
| කවර කඩදාසි | 150 |
| ස්ටිකර් පේපර් | 300 |
| චීප් බෝඩ් | 50 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ එකමතිකව සම්මත විය.**

06.01.28 A&A Enterprises Fire Protection (Pvt)Ltd ආයතනය මඟින් ගිණි නිවන උපකරණ නැවත පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීම හා එම ආයතනය වෙත රු.41,410.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.29 2021 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවේ ගැසට් නිවේදන පළ කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

***2021 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම.***

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ නගර සභා සීමාව ඇතුළත පිහිටියාවූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව/ සත්‍යොක්ෂණය 2021 වර්ෂය සඳහා පාදකකර ගැනීමටත්, එකී තක්සේරුව මත ඉහත කී නගර සභා ආඥා පනතේ 160 වන වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරී ඇති බලතල යටතේ බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ කිසියම් දේපළක් මත ඉහත කී තක්සේරුව සඳහා නියමකර ඇති වාර්ෂික වටිනාකමින්,

(අ). නේවාසික ස්ථාන සඳහා සියයට හතර (4%)ක වාර්ෂික වරිපනම් බදු අනුප්‍රමාණයමද,

(ආ). වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන දේපළයන් මත සියයට පහ (5%)ක වරිපනම් බදු අනුප්‍රමාණයමද,

නියමවිය යුතු බවටත්,

තවද, 2021 වර්ෂයේ පහත උප ලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඊට ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා

අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස සමස්ත වාර්ෂික වරිපනම් බද්ද 2021 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහය(10%)ක වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් සියයට පහ(5%)ක වට්ටමක්ද නගර සභාව විසින් ලබාදිය යුතු වේ.

***ඉහත කී උපලේඛනය***

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| 2021 වර්ෂයේ පළමුවන කාර්තුව | 2021-03-31 | 2021-01-31 |
| 2021 වර්ෂයේ දෙවන කාර්තුව | 2021-06-30 | 2021-04-30 |
| 2021 වර්ෂයේ තුන්වන කාර්තුව | 2021-09-30 | 2021-07-31 |
| 2021 වර්ෂයේ හතරවන කාර්තුව | 2021-12-31 | 2021-10-31 |

## ***2021 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම.***

255 වැනි අධිකාරිය වන 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 165 අ(1)(2) වගන්තිවලින් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2021 වර්ෂය සඳහා පනවා අය කල යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2021 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලයට ගෙවිය යුතු වේ.

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ ස්වභාවය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750/= නොයික්මවන අවස්ථාවක | රු. 750/= ඉක්මවන එහෙත් රු. 1,500/= නොයික්මවන අවස්ථාවක | රු. 1,500/= ඉක්මවන අවස්ථාවක |
| 01 | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 02 | ස්වර්ණාභරණ නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 03 | මැටි භාණ්ඩ නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 04 | දුරකථන/ ඡායාපිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 05 | මැණික් කැපීම හා ඔප දැමීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 06 | මිනී පෙට්ටි නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 07 | වඩු කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 08 | තේ කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 09 | ගමන් මළු නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 10 | පාවහන් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 11 | ගීත/ වීඩියෝ පටිගත කිරීම හෝ තැටිගත කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 12 | පින්තූර රාමු කිරීමේ වැඩපල | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 13 | වාහන බ්‍රේක් ලයිනර්/ ක්ලච් ප්ලේට් නිපදවීමේ වැඩපල | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 14 | ඇඟලුම් කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 15 | පොහොර නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 16 | සිසිල්බීම නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 17 | යෝගට් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 18 | රසකැවිලි නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 19 | ගම් වර්ග නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 20 | විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 21 | ඉටිපන්දම් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 22 | හඳුන්කූරු නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 23 | තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 24 | බිම ඔපදමන පොලිෂ් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 25 | කොහු නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 26 | කොසු/ ඉදල්, පිරිසිදු කිරීමේ උපකරණ නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 27 | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 28 | දුම්කොළ නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 29 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 30 | ඩිජිටල් ප්‍රින්ටින් | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 31 | ඡායා පිටපත් ගැනීමේ ස්ථාන | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 32 | ඇඳුම් මැසීමේ ස්ථාන (ටේලර් ෂොප්) | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 33 | ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථාන | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 34 | ඉලෙක්ට්‍රොනික් උපකරණ අලුත්වැඩියා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 35 | නගර සහ උද්‍යාන අලංකරන සැළසුම් සකස්කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

## *2021 වර්ෂය සඳහා ව්‍යාපාරික බද්ද පැනවීම.*

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 165 (ආ) වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී ආඥා පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 165 අ වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2021 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි 11 වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2021 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2021 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර බලංගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු වේ.

**උපලේඛනය**

| **I වන තීරුව** | **II වන තීරුව** | |
|---|---|---|
| බද්ද අදාල වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද | |
| | රුපියල් | ශත |
| රුපියල් 6,000.00 නොඉක්මවන අවස්ථාවක | - | |
| රුපියල් 6,000.00 ඉක්මවන එහෙත් රුපියල් 12,000.00 නොඉක්මවන අවස්ථාවක | 90 | 00 |
| රුපියල් 12,000.00 ඉක්මවන එහෙත් රුපියල් 18,750.00 නොඉක්මවන අවස්ථාවක | 180 | 00 |
| රුපියල් 18,750.00 ඉක්මවන එහෙත් රුපියල් 75,000.00 නොඉක්මවන අවස්ථාවක | 360 | 00 |
| රුපියල් 75,000.00 ඉක්මවන එහෙත් රුපියල් 150,000.00 නොඉක්මවන අවස්ථාවක | 1,200 | 00 |
| රුපියල් 150,000.00 ඉක්මවන අවස්ථාවක | 3,000 | 00 |

**දෙවන කොටස**

*ව්‍යාපාරික බද්දට යටත්වන විෂයයන්*

01. ආයුර්වේද බෙහෙත් අලෙවිය
02. ඇස් කණ්ණාඩි අලෙවිකිරීම
03. ඉංග්‍රීසි බෙහෙත් අලෙවිය (ෆාමසි)
04. ඉන්ධන පිරවුම්හල

05. උකස්බඩු ගන්නා ස්ථාන

06. උත්සව භාණ්ඩ කුලී පදනම මත සැපයීම

07. කුළු බඩු එකතුකිරීම හා අලෙවිය

08. කෘෂි උපකරණ අලෙවිය

09. කොමිස් නියෝජිතවරුන්/ වෙන්දේසිකරුවන්

10. ඛනිජ තෙල් හා ලිහිසුම් තෙල් අලෙවිය

11. ගෘහ නිර්මාණ සැළසුම් සකසන ස්ථානයක් පවත්වාගෙන යාම

12. ගෘහ භාණ්ඩ අලෙවිය

13. ගෘහ සේවක සේවිකාවන් සැපයීම

14. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය

15. ග්‍රොසරියක් පවත්වාගෙන යාම

16. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම

17. තරාදි අලෙවිය

18. තේ පිටි සකස් කිරීම හා අලෙවිය

19. තොග වෙළඳාම

20. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම

21. දැව/ ලී අලෙවිය

22. දුම්පරීක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

23. දුරකථන අලෙවිය

24. දුරකථන සේවා (කොමිනිකේෂන්)

25. දේශීය වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම /ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම

26. නිමි ඇඳුම් අලෙවිය

27. නොතාරිස්/ නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම

28. පරිගණක අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම

29. පරිසනක/ පරිසනක උපාංග අලෙවිය

30. පාවහන් අලෙවිය

31. පුද්ගලික නියෝජිත තැපැල් කාර්යාල

32. පූජා භාණ්ඩ අලෙවිය

33. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම

34. ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය

35. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (මෙඩිකල් සෙන්ටර්ස්)

36. රටබීම අලෙවිය
37. මල් සහ පැළ වර්ග අලෙවිය
38. මැටි භාණ්ඩ අලෙවිය
39. මිශ්‍ර වෙළඳාම
40. මූල්‍ය ආයතන
41. මෝටර් වාහන අමතර කොටස් අලෙවිය
42. මෝටර් සයිකල් අලෙවිය
43. යන්ත්‍රසූත්‍ර කුලී පදනම මත සැපයීම
44. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
45. රථ වාහන අලෙවිය
46. රථ වාහන කුලී පදනම මත යෙදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. රන් භාණ්ඩ ස්වර්ණාභරණ අලෙවිය
48. රා තැබෑරුමක් පවත්වාගෙන යාම
49. රියදුරු පුහුණු පාසැලක් පවත්වාගෙන යාම
50. රෙදිපිළි වෙළඳාම
51. රේස් ඔට්ටුපොලක් පවත්වාගෙන යාම
52. ලිපිද්‍රව්‍ය පාසැල් උපකරණ අලෙවිය
53. ලේ/ මුත්‍ර පරීක්ෂාව /රසායනාගාර සේවාවන් පවත්වාගෙන යාම
54. ලොතරැයි අලෙවිය
55. විදුලි උපකරණ අලෙවිය
56. විසිතුරු භාණ්ඩ අලෙවිය (ලවර්ස්)
57. වීඩියෝ පටි/ තැටි කුලියට දීම හා අලෙවිය
58. ව්‍යායාම උපකරණ අලෙවිය
59. ශබ්ද විකාශන යන්ත්‍ර කුලී පදනම මත සැපයීම
60. ශරීර සුවතා මධ්‍යස්ථාන
61. සාත්තුසේවා කටයුතු

## ***2021 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම.***

1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත හෙවත් ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරයේ 162 වන වගන්තිය හා 164 වන වගන්තිය ප්‍රකාරව හා 2019-12-05 දිනැති අංක 2152/34 අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කර ඇති බලංගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන අන්තරාදායක, අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ

සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත්, පනතේ 164 වගන්තියේ 1 තීරයේ සඳහන් වාර්ෂික වටිනාකම් මත එහි 11 තීරයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2019-12-05 දිනැති අංක 2152/34 අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කාර්යයන් සඳහා අය කරනු ලැබේ.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝටලයක්, ආපනශාලාවක්, නවාතැන්පලක් වන විටකදී ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ පෙර වර්ෂයේ ලැබීම් වලින් 1%(සියයට එක)ක් බලපත්‍ර ගාස්තු ලෙස 2021 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එම නියමය 2021 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ

| I වන තීරය | 11 වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම- | රු.ශත |
| රු.750 නොයික්මවන විට | 500.00 |
| රු.750 ඉක්මවන නමුත් රු,1500 නොයික්මවන විට | 750.00 |
| රු.1500 නොයික්මවන විට | 1,000.00 |

## *2021 වර්ෂය සඳහා බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තු පැනවීම.*

බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව බලංගොඩ නගර සභා සීමාව ඇතුළත ඇතිකරනු ලබන සෑම බල්ලෙක් හා බැල්ලියක් වෙනුවෙන් 2021 වර්ෂයේදී මෙම සභාවට ගෙවිය යුතු වාර්ෂික බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව හා කරපටි ගාස්තුව ලෙස රුපියල් එකසීය පනහ (150.00)ක් විය යුතු බවට පනවා එම පැනවීම 2021 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

## *2021 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම.*

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය වූ නගර සභා ආඥා පනතේ 170(අ) 1,2 වගන්ති හා එහි 157(9)(ආ) ප්‍රකාරවත් 1952 අංක 06 දරණ පළාත් පාලන මණ්ඩල ආදර්ශ උපනීති XXI අනුවත්, 2013-06-28 දිනැති නගර සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා අනුව කසල ගාස්තු අය කල යුතු ආයතන හා ගාස්තු පහත පරිදි වේ.

| ස්වභාවය | වාර්ෂික ගාස්තු රු | කාර්තුවකට අය කල යුතු මුදල |
|---|---:|---:|
| නවාතැන්පල | 4,080.00 | 1,020.00 |
| හෝටල් | 4,080.00 | 1,020.00 |
| බේකරි | 4,800.00 | 1,200.00 |

| | | |
|---|---|---|
| රෙදිකඩ | 4,800.00 | 1,200.00 |
| බත්කඩ,කෝපි කඩ,ආපන ශාලා,තේ කඩ | 2,400.00 | 600.00 |
| භෝජනාගාර | 4,080.00 | 1,020.00 |
| සුපිරි වෙළඳසැල් | 9,600.00 | 2,400.00 |
| සිල්ලර කඩ | 1,800.00 | 450.00 |
| තේ කඩ | 2,400.00 | 600.00 |
| සැලූන්,රූපලාවන්‍යාගාර | 1,200.00 | 300.00 |
| වී මෝල් | 3,600.00 | 900.00 |
| පුද්ගලික පන්ති | 3,000.00 | 750.00 |
| තොග වෙළඳසැල් | 6,000.00 | 1,500.00 |
| හාඩ්වෙයාර් | 1,800.00 | 450.00 |
| සුරාසැල් | 4,800.00 | 1,020.00 |

## *2021 වර්ෂය සඳහා ගෝ ඝාතක ආඥා පනත ප්‍රකාරව කොටු ගාස්තු පැනවීම.*

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 162(1) අ වන වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරී ඇති බලතල අනුව 1893 අංක 09 දරණ ගෝ ඝාතක ආඥා පනතේ 09 වන වගන්තිය ප්‍රකාරවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 10939 හා 1956-06-08 ගැසට් නිවේදනයේ අංක XV අනුව මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි කොටු ගාස්තු නියම කර 2021 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**උපලේඛනය**

- ගවයෙක් ඝාතනය කිරීමේ කොටු ගාස්තුව — රු 200.00
- එළුවෙක් ඝාතනය කිරීමේ කොටු ගාස්තුව — රු 100.00
- තාවකාලික සෝ ඝාතක බලපත්‍ර ගාස්තුව — රු 500.00
- වාර්ෂික සෝ ඝාතක බලපත්‍ර ගාස්තුව — රු1,000.00

## *2021 වර්ෂය සඳහා බලංගොඩ නගර සභාවෙන් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම.*

**උප ලේඛනය**

| අනු අංකය | සේවාව | කාරණය | 2021 වර්ෂයට ගාස්තුව |
|---|---|---|---|
| 01 | ජල සහතිකයක් ලබා ගැනීම | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ සහතික ගාස්තුව | රු. 100.00<br>රු. 200.00 |
| 02 | විදුලි සහතිකයක් ලබා ගැනීම | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ සහතික ගාස්තුව | රු. 100.00<br>රු. 200.00 |
| 03 | ගොඩනැගිලි රේඛා සහතිකයක් ලබා ගැනීම | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ සහතික ගාස්තුව | රු. 100.00<br>රු. 750.00 |
| 04 | ජල බවුසරය කුලියට සැපයීම | ▪ පානීය ජල බවුසරයක්<br>▪ පානීය නොවන ජල බවුසරයක්<br>▪ ස්ථානයේ නතරකර තැබීම දිනකට<br>( නගර සීමාවෙන් පිටතට යන සෑම 1Km සඳහා රු.300.00 බැගින් එකතු වේ.) | රු. 3,000.00<br>රු. 2,750.00<br>රු. 2,000.00 |
| 05 | ක්‍රීඩා පිටිය කුලියට දීම | ▪ ක්‍රීඩා පිටිය පමණක් දිනකට<br>▪ ප්‍රේක්ෂකාගාරය සමඟ දිනකට<br>▪ සැණකෙලි හා සංගීත සංදර්ශන එක් රාත්‍රියක් පැවැත්වීම සඳහා<br>▪ ක්‍රීඩා උත්සව පැවැත්වීම-එක් රාත්‍රියක් සඳහා | රු. 3,000.00<br>රු. 5,000.00<br>රු.25,000.0<br>රු,10,000.00 |
| 06 | ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීම | යන්ත්‍ර පැයක් සඳහා<br>(ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු. 2,400.00 |
| 07 | ලෙලෙන තලනය කුලියට දීම (ටොන් 01)<br>ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 01)<br>ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 10) | පැය අටක සේවා දින භාගයක් සඳහා(දින 1/2)<br>පැය අටක සේවා දිනක් සඳහා<br>යන්ත්‍ර පැය එකක් සඳහා<br>(ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු. 3,000.00<br>රු. 4,920.00<br>රු. 3,325.00 |
| 08 | මෝටර් ග්‍රේඩරය කුලියට දීම | යන්ත්‍ර පැය එකක් සඳහා<br>(ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු.2,850.00 |
| 09 | කොඩි කණු කුලියට ලබා දීම | එක කණුවක් එක දිනකට | රු. 50.00 |
| 10 | ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | රු. 200.00 |
| 11 | බිම් කට්ටි සැළසුම් අනුමත කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | රු. 100.00 |

| | | | |
|---|---|---|---|
| 12 | ගලි සේවාව සැපයීම<br>ලීටර් 2500 ගලි බවුසරය<br>සඳහා | නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු. 5,000.00 |
| | | නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා | රු. 6,000.00 |
| | | නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා | රු. 9,250.00 |
| | | නගර සීමාවෙන් පිටත නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු.8,750.00 |
| | | නගර සීමාවෙන් පිටතට කි.මී 25ට වඩා යාමේදී කිලෝමීටර් 1ක් සඳහා | රු. 100.00 |
| | ගලි සේවාව සැපයීම ලීටර් 4000 ගලි බවුසරය සඳහා | නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු,6,750.00 |
| | | නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා | රු,7,750.00 |
| | | නගර සීමාවෙන් පිටත නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු,10,500.00 |
| | | නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා | රු,11,000.00 |
| | | නගර සීමාවෙන් පිටතට කි.මී 25ට වඩා යාමේදී කිලෝමීටර් 1ක් සඳහා | රු.175.00 |
| 13 | සුසාන භූමි ගාස්තු | ▪ මිනියක් මිහිදන් කිරීම<br>▪ සභා සේවකයින් 02ක් සැපයීමේ ගාස්තුව<br>▪ ස්මාරක ඉදිකිරීමේ ගාස්තුව<br>▪ අළු තැන්පත් කිරීම වර්ග අඩි 01ක කුටිය | රු. 1,300.00<br>රු. 3,000.00<br><br>අවසරනැත<br>රු.15,000.00 |
| 14 | නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ සහතික ගාස්තුව | රු. 100.00<br>රු. 750.00 |
| 15 | අනතුරුදායක ගස් පරීක්ෂා කිරීම | ▪ පරීක්ෂණ ගාස්තු | රු.500.00 |
| 16 | වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | රු. 100.00 |
| 17 | තක්සේරු ලේඛනයට නම ඇතුළත් කිරීම | ලියාපදිංචි ගාස්තුව | රු. 600.00 |
| 18 | තක්සේරු ලේඛනයේ පිටපතක් ලබා ගැනීම | පිටපතක් සඳහා ගාස්තු | රු. 100.00 |
| 19 | වර්පනම් උදෘත ලබා ගැනීම | එක් වර්ෂයක් සඳහා ගාස්තුව | රු. 100.00 |

| | | | |
|---|---|---|---|
| 20 | ප්‍රචාරක දැන්වීම් ,බැනර්,පෝස්ටර්,කටවුට් ප්‍රදර්ශනය කිරීම<br>ප්‍රචාරක දැන්වීම් ,බැනර්,පෝස්ටර්,කටවුට් ප්‍රදර්ශනය කිරීම | වර්ග අඩි 01ක් දින 14ක් ප්‍රදර්ශනය කිරීම<br>වර්ග අඩි 01ක් මාසයක් ප්‍රදර්ශනය කිරීම | රු. 75.00<br>රු,150.00 |
| 21 | දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම-ස්ථිර | වර්ග අඩි 01 ක් වර්ෂයක් සඳහා ප්‍රදර්ශනය කිරීම<br>වර්ග අඩි 01ක් සහා දේපල තුළ වර්ෂයක් ප්‍රදර්ශනය සඳහා බිම් කුලිය | රු. 150.00<br>රු,250.00 |
| 22 | අනවසර ප්‍රචාරක දැන්වීම් සඳහා දඩ ගාස්තු | කටවුට් වර්ග අඩි 01ක් සඳහා<br>පෝස්ටර් වර්ග අඩි 01ක් සඳහා<br>බැනර් වර්ග අඩි 01ක් සඳහා | රු,200.00<br>රු,100.00<br>රු,200.00 |
| 23 | එල්.ඊ.ඩී ප්‍රචාරක දැන්වීම් | වර්ග අඩි 01ක් මාසයක් ප්‍රදර්ශනය කිරීම සඳහා | රු,80.00 |
| 24 | පුස්තකාල ගාස්තු අය කිරීම. | සාමාජික අයදුම් පත්‍ර ගාස්තුව | රු,10.00 |
| | | නගර සීමාව තුළ ළමා සාමාජික ගාස්තු | රු,100.00 |
| | | නගර සීමාව තුළ වැඩිහිටි සාමාජික ගාස්තු | රු,200.00 |
| | | නගර සීමාව තුළ ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු | රු,50.00 |
| | | නගර සීමාව තුළ වැඩිහිටි සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු | රු,50.00 |
| | | නගර සීමාවෙන් පිට වැඩිහිටි සාමාජික ගාස්තු | රු,300.00 |
| | | නගර සීමාවෙන් පිට ළමා සාමාජික ගාස්තු | රු,150.00 |
| | | නගර සීමාවන් පිට ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව | රු,100.00 |
| | | නගර සීමාවන් පිට වැඩිහිටි සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව | රු,100.00 |
| | | පාඨක සමාජයටඇතුළත් වීමේ ගාස්තුව | රු,5.00 |
| | | පාඨක සමාජයේ සාමාජික ගාස්තු වසර දෙකක් සඳහා | රු,120.00 |
| | | එක් දිනකට එක් පොතක් සඳහා පොත් ප්‍රමාද ගාස්තුව | රු,2.00 |
| | | නැතිවූ පොතක් සඳහා පොතේ නියම වටිනාකම සහ දෙපාර්තමේන්තු ගාස්තු ලෙස පොතේ වටිනාකමින් | 25% |
| | | පොත් බැඳීමේ ගාස්තු | රු,200.00 |

| | | | |
|---|---|---|---|
| 25 | පා පැදි බලපත්‍රය | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ බලපත්‍රය | රු. 100.00<br>රු. 5.00 |
| 26 | අනුමත මිනින්දෝරු සැළැස්ම | ▪ සහතික පිටපතක් නිකුත් කිරීම<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම පමණක් ලබා දී ඇති විට<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා වර්ෂය ලබා දී ඇති විට<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා අංකය ලබා දී ඇති විට | රු. 250.00<br>රු.500.00<br>රු.300.00<br>රු,200.00 |
| 27 | අනුමත ගොඩනැගිලි සැළැස්ම | ▪ කාලය දීර්ඝ කර ගැනීම-එක් වසරක් සඳහා<br>▪ සහතික පිටපතක් නිකුත් කිරීම<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම පමණක් ලබා දී ඇති විට<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා වර්ෂය ලබා දී ඇති විට<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා අංකය ලබා දී ඇති විට | රු ,500.00<br>රු. 500.00<br>රු.500.00<br>රු,300.00<br>රු,200.00 |
| 28 | පෙර පාසැල | ▪ ළමුන් ඇතුළත් කිරීමේ ගාස්තුව (එක් වර්ෂයකට) | රු. 2,000.00 |
| 29 | අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් | ▪ එක දිනක් සඳහා බිම් බද්ද<br>▪ වැඩිවන අමතර දිනයක් සඳහා | රු. 3,000.00<br>රු. 1,000.00 |
| 30 | කාබනික පොහොර අළෙවිය(මුද්‍රිත කවරය සහිතව) | ▪ කිලෝ 50 පොහොර උරයක්<br>▪ කිලෝ 25 පොහොර උරයක්<br>▪ කිලෝ 10 පොහොර උරයක් | රු. 350.00<br>රු. 175.00<br>රු. 100.00 |
| | කාබනික පොහොර අළෙවිය(මුද්‍රිත කවරය රහිතව) | ▪ කිලෝ 50 පොහොර උරයක්<br>▪ කිලෝ 25 පොහොර උරයක්<br>▪ කිලෝ 10 පොහොර උරයක්<br>(කාබනික පොහොර කිලෝ 01 ක මිල රු,5.00 බැගින් කවර රහිතව ලබා දේ) | රු,250.00<br>රු,125.00<br>රු,50.00 |
| 31 | මාර්ග පළුදු කිරීම | ▪ කාපට් ඇතිරූ මාර්ග තලය පළුදු කිරීම<br>▪ තාර/ කොන්ක්‍රීට්/ අන්තර් සම්බන්ධිත ගල් අතුරන ලද මාර්ග තලය පළුදු කිරීම වර්ග මීටර් 01ක් සඳහා<br>▪ පස් සහිත මාර්ග උරහිස සහ මාර්ග තලය පළුදු කිරීම වර්ග මීටර් 01ක් සඳහා | අවසර නැත<br>රු520.00<br>රු,155.00 |
| 32 | පොදු වැසිකිළි ගාස්තු | ▪ වැසිකිළි/ කැසිකිළි යාම සඳහා එක් වරකට<br>▪ බස්නැවතුම්පල උඩුමහලේ ඇති වැසිකිළිය බස්නැවතුම්පල කඩ හිමියන් හා බස්නැවතුම්පල බස්රථ රියදුරන් හා කොන්දොස්තර මහතුන් සඳහා වැසිකිළි/ කැසිකිළි යාම සඳහා එක් වරකට | රු. 10.00<br>රු.5.00 |
| 33 | හිස් තාර බැරල් | ▪ එක තහඩුවක් සඳහා | රු. 150.00 |
| 34 | ලේඛනාගාරයෙන් ලිපි/ලේඛන ස්කෑන් කර ලබා ගැනීම. | ▪ A-4 කොලයක් සඳහා<br>( A-4 කොල 25කට වඩා ස්කෑන් පිටපත් අවශ්‍ය වන්නේ නම් 1ක් රු,7.00 ක් වේ)<br>▪ ලීගල් කොලයක් සඳහා<br>(ලීගල් කොල 25කට වඩා ස්කෑන් පිටපත් | රු,10.00<br>රු,12.00 |

| | | | |
|---|---|---|---|
| | | අවශ්‍ය වන්නේ නම් 1ක් රු,8.00වේ.)<br>■ A-3 කොලයක් සඳහා<br>■ A-3 කොලවලට වඩා ප්‍රමාණයෙන් විශාල කොළ වර්ග අඩියක් සඳහා | රු,25.00<br>රු,20.00 |
| 35 | බලංගොඩ නව බස්නැවතුම්පොළ කඩ කාමර සඳහා | ■ ජල සම්බන්ධතා ලබා ගැනීමේ ගාස්තුව<br>■ ජල සම්බන්ධතා මාසික ගාස්තුව(මාසික ජල බිල් පත අනුව අය කරනු ලබයි)<br>■ විසන්ධි කළ ජල සම්බන්ධතාවය නැවත ලබා ගැනීම | රු,4,000.00<br>රු,1,000.00 |
| 36 | සනීපාරක්ෂක තුවා /ළමා හා වැඩිහිටි ඩයපර්ස් | ■ කිලෝ එක හෝ එකට අඩු<br>■ කිලෝ එකේ සිට දෙක දක්වා<br>■ කිලෝ දෙකේ සිට තුන දක්වා (නොදිරන කසල එකතු කිරීමේ ට්‍රැක්ටර් රථයට අදාළ මුදල ගෙවා භාරදිය යුතුය) | රු,30.00<br>රු,40.00<br>රු,50.00 |

ඉහත සඳහන් සියලු ගාස්තුවලට අමතරව රජයේ අනුමත බදු වෙනමම එකතු කරනු ලැබේ.

## ***මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් ප්‍රදර්ශනය සම්පූර්ණයෙන්ම තහනම් දින නිවේදනය කිරීම - 2021 වර්ෂය***

පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන දිනයනුත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පනවනු ලබන දිනයනුත් බළන්ගොඩ නගර සභාව විසින් අවස්ථාවෝචිත පරිදි තීරණය කරනු ලබන දිනයන්හිත් , බළන්ගොඩ නගර සීමාවේ 2021 වර්ෂයේ මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් විකිණීම හෝ විකිණීම සඳහා මස් ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා මස් ලඟ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් කරන ලද අතර මෙකී නිවේදනය 2021 වර්ෂයේ ජනවාරි මස 01වන දින සිට ක්‍රියාත්මක වියයුතු වේ.

**උපලේඛනය**

| අනු අංකය | වර්ෂය | මාසය | දිනය | කාරණය |
|---|---|---|---|---|
| 01 | 2021 | ජනවාරි | 14-බ්‍රහස්පතින්දා | තෛපොංගල් දිනය |
| 02 | 2021 | ජනවාරි | 28- බ්‍රහස්පතින්දා | දුරුතු පුර පසළොස්වක |
| 03 | 2021 | පෙබරවාරි | 04- බ්‍රහස්පතින්දා | ජාතික නිදහස් දිනය |
| 04 | 2021 | පෙබරවාරි | 26-සිකුරාදා | නවම් පුර පසළොස්වක |
| 05 | 2021 | මාර්තු | 11-බ්‍රහස්පතින්දා | මහ ශිව රාත්‍රී දිනය |
| 06 | 2021 | මාර්තු | 28-ඉරිදා | මැදින් පුර පසළොස්වක |
| 07 | 2021 | අප්‍රේල් | 02-සිකුරාදා | මහ සිකුරාදා |
| 08 | 2021 | අප්‍රේල් | 13-අඟහරුවාදා | සිංහල දෙමළ අළුත් අවුරුදු දිනට පෙර දිනය |

| | | | | |
|---|---|---|---|---|
| 09 | 2021 | අප්‍රේල් | 14-බදාදා | සිංහල දෙමළ අළුත් අවුරුදු දිනය |
| 10 | 2021 | අප්‍රේල් | 26-සඳුදා | බක් පුර පසළොස්වක |
| 11 | 2021 | මැයි | 01-සෙනසුරාදා | ලෝක කම්කරු දිනය |
| 12 | 2021 | මැයි | 26-බදාදා | වෙසක් පුර පසළොස්වක |
| 13 | 2021 | මැයි | 27-බ්‍රහස්පතින්දා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 14 | 2021 | ජූනි | 24-බ්‍රහස්පතින්දා | පොසොන් පුර පසළොස්වක |
| 15 | 2021 | ජූලි | 23-සිකුරාදා | ඇසළ පුර පසළොස්වක |
| 16 | 2021 | අගෝස්තු | 22-ඉරිදා | නිකිණි පුර පසළොස්වක |
| 17 | 2021 | සැප්තැම්බර් | 20-සඳුදා | බිනර පුර පසළොස්වක |
| 18 | 2021 | ඔක්තොම්බර් | 19-අඟහරුවාදා | (මිලා-දුන්-නබි)නබිනායකතුමාගේ උපන් දිනය |
| 19 | 2021 | ඔක්තොම්බර් | 20-බදාදා | වප් පුර පසළොස්වක |
| 20 | 2021 | නොවැම්බර් | 04-බ්‍රහස්පතින්දා | දීපවාලි උත්සව දිනය |
| 21 | 2021 | නොවැම්බර් | 18-බ්‍රහස්පතින්දා | ඉල් පුර පසළොස්වක |
| 22 | 2021 | දෙසැම්බර් | 18-සෙනසුරාදා | උඳුවප් පුර පසළොස්වක |
| 23 | 2021 | දෙසැම්බර් | 25-සෙනසුරාදා | නත්තල් උත්සව දිනය |

***<u>රථවාහන නැවතුම් සීමාව සහ රථ වාහන නැවතුම් ගාස්තු නිවේදනය කිරීම -2021 වර්ෂය</u>***

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 157(14)(අ) වගන්ති ප්‍රකාරවත් ඊට අදාළ අතුරු ව්‍යවස්ථාවන් යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත් බළන්ගොඩ නගර සභා බලසීමාවේ රථ වාහන නතර කිරීමේදී රථවාහන නැවතුම් ගාස්තු අය කරනු ලබන සීමාව පහත I වන උප ලේඛනයේ සවිස්තරාත්මකව දක්වන ලද ආකාරයටත්, එම සීමාව ඇතුළත නතර කරනු ලබන එක් එක් රථ වාහනයකින් එක් දිනයකට අයකළ හැකි උපරිම ගාස්තු මුදල පහත II වන උප ලේඛනයේ සවිස්තරාත්මකව දැක්වෙන ආකාරයට විය යුතු වේ.

**ඉහත කී I වන උපලේඛනය**

බළන්ගොඩ නගර සභා බල සීමාවේ වෙළඳපල සීමාව ලෙස නම්කර ඇති සීමාවේ කොටසක් වන බළන්ගොඩ බදුල්ල මාර්ගයේ කිරිදිගල පල්ලිය (වැලිහරනාව හන්දිය) දක්වා ද, බළන්ගොඩ රාස්සගල පාරේ කොන්වන්ට් විදුහල දක්වා ද, බළන්ගොඩ රත්නපුර මාර්ගයේ HLW ඉන්ධන පිරවුම්හල දක්වාද, බළන්ගොඩ කල්තොට පාරේ ධර්මරත්න බස්නායක මහතාගේ නිවස දක්වාද, දොරවෙල නව අතුරු මාර්ගය( මොහාන් සාලිය එල්ලාවල මාවත) ද, ඇතුළත් වන පරිදි බළන්ගොඩ නගරයේ කෙළින් වීදිය, තානායම් පිවිසුම් පාර, බාන්ස් රත්වත්ත මාවත, බස් නැවතුම්පල පාර, පල්ලිය පාර හා ඒ ඇතුළත ඇති සියලුම වීථීන් හා වීථීන් දෙපස ගොඩනැගිලි සීමාව ඇතුළත වන සීමාව වේ.

**ඉහත කී II වන උපලේඛනය**

- ලොරියක්, බස්රථයක් හෝ වෙන යම් වාහනයකින් - රු. 50.00
- වෑන් රථයක්, ජීප් රථයක් -රු. 40.00
- මෝටර් කාර් රථයක් හෝ මෝටර් රථයක් -රු. 30.00
- ත්‍රී රෝද රථයක් - රු. 20.00

***<u>2021 වර්ෂය සඳහා විනෝද බදු අය කිරීම</u>***

විනෝද බදු ආඥා පනතේ 06 වන වගන්තිය අනුව බලංගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ සිනමා ශාලා වල සිනමා දර්ශන සඳහා නිකුත් කරන ටිකට් පතක මුහුණත වටිනාකමින් 7.5% ක්ද ,අනෙකුත් විනෝද කටයුතු සඳහා ටිකට්පතක මුහුණත වටිනාකම රු,100.00 නොයික්මවන අවස්ථාවක 20% ක ප්‍රතිශතයක්ද, ටිකට්පතක මුහුණත වටිනාකම රු,100.00 ට වැඩි අවස්ථාවක 25% ක විනෝද බදු ප්‍රතිශතයක් අය කරනු ලබන බවත් එය 2021 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

ඉහත සඳහන් පරිදි 2021 වර්ෂයට අදාළ ගැසට් නිවේදන පළ කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.30 බළන්ගොඩ නගර සභා සීමාව තුළ සිටින අඩුබර ළමුන් සඳහා පෝෂණ මල්ලක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.31 කිරිඳිගල සියඹලාගහවත්ත ගමේ පාර සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.32 බළන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අත්පත් කර නොගත් ඉඩම් කොටසක් පවතින බැවින් එම ඉඩම් කොටස සභාවේ අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා අත්පත් කර ගැනීම සිදු කළ යුතුව ඇත. එබැවින් මෙම අත්පත් කිරීමේ කටයුතු සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.33 ගිනි අනතුරු වැළැක්වීම පිළිබඳ පුහුණු වැඩසටහන පැවැත්වීම සහ ඒ සඳහා ගිනි නිවීමේ වෘත්තිකයන්ගේ සංගමයේ සභාපති, බළන්ගොඩ නගර සභාවේ ගිනි නිවීමේ උපදේශක තනතුර සඳහා පත්කර ගත් රුක්ෂාන් බුවනෙක මහතාගේ සම්පත් දායකත්වය ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.34 නගර සීමාවට අයත් නොවන වරිපනම් බදු කපා හැරීමේ ලේඛනය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.35 බළන්ගොඩ නගර සභාවේ වැඩ අධිකාරි තනතුරේ බලතල හා රාජකාරි පැවරීම. - පී.එම්.එස්.සේනාධීර මයා

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.36 2020.10.10 දිනට මාර්ගස්ථ මුදල් රක්ෂණය අලුත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම. - රු.73,995.08

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.37 2020.10.10 දිනට විදුලි කාර්මික රක්ෂණාවරණය අලුත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම. රු.12,065.01

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.38 2020-02-20 දින හා 2020-07-28 දින පැවති පරිසර සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු වාර්තා සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.39 බළන්ගොඩ නගර සභාවේ විද්‍යුණැන පියස මධ්‍යස්ථානයේ පරිගණක යාවත්කාලීන කර නව SSD Hard Disc සවිකර, නව මොනිටර් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.40 2021 වර්ෂය සඳහා සැපයුම්කරුන් ලියාපදිංචි කිරීමේ අයිතම ලැයිස්තු අනුමත කිරීම.

| අනු අංකය | කාණ්ඩය |
|---|---|
| 01. | කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය |
| 02. | වානේ ගෘහ භාණ්ඩ හා ලී බඩු |
| 03. | පරිගණක, පරිගණක උපාංග හා මුද්‍රණ තීන්ත, CD තැටි, ටෝනර්, කාර්ට්‍රිජ්, රිබන්, පරිගණක මෘදුකාංග |

| | |
|---|---|
| 04. | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය |
| 05. | මාර්ග නඩත්තු උපකරණ හා ද්‍රව්‍ය<br>6×9, 6×4, 4×4, 4×2, 2×2, 1 1/2, 1, 3/4, 1/2 ප්‍රමාණයේ කළුගල්, ගල් කුඩු, ABC, සියලුම ජල සැපයුම් පයිප්ප හා උපාංග, හියුම් පයිප්ප, කොන්ක්‍රීට් නිෂ්පාදන, ගංගා වැලි |
| 06. | නාම පුවරු, දැන්වීම් හා සමරු ඵලක, බැනර්, කටවුට්, ඩිජිටල් පෝස්ටර් ආදිය |
| 07. | ක්‍රීඩා භාණ්ඩ, ළදරු පාසල් උපකරණ |
| 08. | තීන්ත වර්ග ( එනමල්, ඉමල්ෂන්, මළ නිවාරණ තීන්ත) |
| 09. | විදුලි උපකරණ ( විදුලි පහන් ඇතුළු සියලු විදුලි අයිතමයන්) |
| 10. | මුද්‍රණ කටයුතු හා රබර් මුද්‍රා නිෂ්පාදන, මුද්‍රිත පෝරම |
| 11. | කාර්යාල උපකරණ අලුත්වැඩියාව (යතුරුලියන, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වේලා සටහන් යන්ත්‍ර, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ආදී අනිකුත් යන්ත්‍ර |
| 12. | වාහන සේවා/අලුත්වැඩියා, වාහන අමතර කොටස් (ටයර්, ටියුබ්, බැටරි ඇතුළු අනෙකුත් අමතර කොටස්) |
| 13. | කුලී පදනම මත ගල් වැලි ප්‍රවාහනය සඳහා ටිපර් රථ සැපයීම. |
| 14. | සෞඛ්‍යය උපකරණ හා විෂබීජ නාශක ද්‍රව්‍ය (සබන්, කුණු ඉවත් කිරීමේ ද්‍රව්‍ය) |
| 15. | පිඟන් භාණ්ඩ |
| 16. | පුස්තකාල පොත් |
| 17. | නිළ ඇඳුම් සඳහා රෙදි සැපයීම. |
| 18. | ශ්‍රව්‍ය උපකරණ, දෘශ්‍ය උපකරණ, පටිගත කිරීම් උපකරණ ආදිය සැපයීම. |
| 19. | පරිභෝජන භාණ්ඩ, වියළි සහ අනිකුත් ආහාර ද්‍රව්‍ය සැපයීම. |
| 20 | ඉහත සඳහන් නොවුණු වෙනත් අයිතමයන් (සඳහන් කරන්න) |

**කොන්ත්‍රාත්කරුවන්**

| අනු අංකය | කාණ්ඩය |
|---|---|
| 01. | රු. 100,000/- දක්වා |
| 02. | රු. 100,000/- සිට 250,000 දක්වා |
| 03. | රු. 250,000 සිට රු. 500,000/- දක්වා |
| 04. | රු. 500,000/- සිට 1,000,000 දක්වා |
| 05. | රු. 1,000,000/- ට වැඩි |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.41 සේවා ගිවිසුම් සකස් කිරීම හා සේවයේ යොදවා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ටී.ඒ.ජේමසිරි
- කේ.ජයකොඩි
- ටී.සුබ්‍රමනියම්
- බී.ආර්.කරුණාදාස
- එන්.බී.ගුණපාල
- කේ.එච්.නිමලදාස

- ඩබ්.බී.සිරිසේන
- යූ.එම්.උපාලි මුණසිංහ
- ආර්.ජයසුන්දර
- ඩී.ජේ.උපුල් ශාන්ත
- ජී.දයාරත්න
- ඩබ්.ඒ.සමරදාස
- ආර්.ජී.ජයතිලක
- ඩබ්.ඩබ්.ෂෙල්ටන් පීරිස්
- කේ.ජී.තරිඳු ලක්මාල්
- ධර්මකීර්ති
- පී.ත්‍යාගරාජා
- ටී.ඩී.සන්ධ්‍යානි
- එච්.එම්.අනුර ප්‍රේමසිරි
- ආර්.කේ.ඩී.නිලන්ති
- කේ.නාලක
- ආර්.ක්‍රිෂ්ණන්
- ලාල් ගුණරත්න
- එම්.වීරසිරි

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.43 2021 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල අංක 15,16 සහ 17 දරණ මස් කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.44 2021 වර්ෂය සඳහා නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.45 2021 වර්ෂය සඳහා නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අය කිරීම ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.46 2021 වර්ෂය සඳහා මහජන පොළ ආපන ශාලාව ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.47 2020 වර්ෂය සඳහා පොදු වෙළෙඳසැල මාළු කඩ ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා, පොදු වෙළෙඳසැල මාළු කඩ ටෙන්ඩර් කිරීමට විරුද්ධත්වයක් නොමැති අතර මාළු කඩ පිළිබඳ නඩු තීන්දුව ලැබුණු පසු මෙම කඩ කාමර ටෙන්ඩර් කිරීම සුදුසු බව පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමන් පවසා සිටියේ දැනට මාලු කඩ ටෙන්ඩර් නොකරන අතර නඩු තීන්දුව ලැබුණු පසු ටෙන්ඩර් කරන බවද එතෙක් මෙම කාරණය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවද පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.48 දැනට පොළ පරිශ්‍රයේ පවතින මාලු කඩ සියල්ල පොදු වෙළෙඳසැල පිටුපස ස්ථාපනය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.49 බැංකියවත්ත කුණු කන්ද පහළට ඒම වැළැක්වීම සඳහා ස්කැවේටර් යන්ත්‍ර යොදා සකස් කිරීම සඳහා මිළ ගණන් අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

බැංකියවත්ත කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේ ඇති කසළ කන්ද කපා සකස් කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව ආයතන තුනකින් මිළ ගණන් ඉදිරිපත් කර තිබූ අතර DC-120 එස්කැවේටර් යන්ත්‍රයකට යන්ත්‍ර පැය එකක් සඳහා රු.4,000.00 ක මුදලක් හා DC-120 arm එස්කැවේටර් යන්ත්‍රයක් සඳහා යන්ත්‍ර පැය 01 ක් සඳහා රු.4350.00ක මුදලක්ද ඉදිරිපත් කර තිබූ ලක්මාල් එන්ටර්ප්‍රයිසස් ආයතනයේ අවම මිළ ගණන් පිළිගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.50 සනීපාරක්ෂක තුවා පිළිස්සීම සඳහා බැංකියවත්ත කොම්පෝස්ට් අංගනයේ 5'X5X6' ප්‍රමාණයේ වලවල් දෙකක් සකස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, මෙම අපද්‍රව්‍ය ප්‍රමාණය දිනෙන් දින වැඩිවන අතර වෙනත් විසඳුමක් නොමැති බව පවසන ලදී. එබැවින් මෙය අත්හදා බැලීමක් ලෙස සිදුකරන බවද මේ සඳහා මාර්ගෝපදේශනය හිටපු මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතා විසින් සිදු කරන ලද බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.51 සභාව සතු දේපළ වලට අදාලව ඇති කිවුලේවෙල කුඹුර(ඉඩම් කොටස) භුක්ති විඳින අය වෙත ලබා දීම සහ ලේඛනවල සඳහන්ව ඇතත් භෞතිකව නොමැති සභාව සතු දේපලවල කුලිය ලේඛනවලින් කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.52 අංක 43, දොරවෙල , බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි ඩී.එම් සමීර කසුන් දයාරත්න යන අය විසින් තමාට පිය උරුමයෙන් ලැබී ඇති ඉඩම් ප්‍රමාණය පර්චස් 4.5 ක් පමණක් වන අතර එහි අබලන් වී ඇති නිවස ජීවත් වීම සඳහා සුදුසු තත්ත්වයට අළුත්වැඩියා කර ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා ඇත. ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ සානුකම්පිතව සළකා බලා මෙම කාරණය සඳහා සභා අනුමැතිය ලබා දිය යුතු නමුත් වෙනත් ආකාරයකින් ඉඩම් විකිණීම් මත ගැනෙන පර්චස් 06 ට වඩා අඩු ඉඩම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු නොවන බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.53 නව බස්නැවතුම්පල වෙළෙඳ සංකීර්ණයේ ජල සම්බන්ධතාවය හා විදුලි සම්බන්ධතාවය විධිමත් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, නව බස්නැවතුම්පල වෙළෙඳ සංකීර්ණයේ ජල මීටරය සවිකර ජල සම්බන්ධතාවය ලබා දීමට රු.4000.00 ක සම්බන්ධතා ගාස්තුවක් අය කර මාසික ජල බිල්පත බදුකරු විසින් නගර සභාව වෙත ගෙවිය යුතු බවද අදාළ විදුලි බිල්පත මාසිකව පරීක්ෂා කිරීම සුදුසු බවටද ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිරකරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.54 2020 සැප්තැම්බර් මස කර්මාන්ත අංශය මඟින් ඉටු කිරීමට අපේක්ෂිත කර්මාන්ත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

01. සුදර්ශනගම මාර්ගය දෙවනවර තාර දැමීම.

02. දෙණියකුඹුර මාර්ගය දෙවනවර තාර දැමීම.

03. දංගමුව වලව්ව පාර දෙවනවර තාර දැමීම.

04.කරව්කැටිය 9වන පටුමඟ දෙවනවර තාර දැමීම.

***මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය***

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

***මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය***

| | | |
|---|---|---|
| සිමෙන්ති | - | මිටි 50 |
| ගංගා වැලි | - | කියුබ් 08 |

| | | |
|---|---|---|
| 3/4 මෙටල් | - | කියුබ් 05 |
| 1 1/2 මෙටල් | - | කියුබ් 06 |
| මි.මී. 12 කම්බි | - | 30 |
| මි.මී.10 කම්බි | - | 30 |
| මි.මී.6 කම්බි | - | 30 |
| බයින්ඩින් | - | කිලෝ 05 |
| තාර බැරල් | - | 20 |

***මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන***

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 20 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.56 බස්නැවතුම්පලේ පිහිටි ඩිජිටල් දැන්වීම් පුවරුව සංජීව ලක්මාල් කාරියවසම් යන අයගේ නමින් ගිවිසුම් ගත වීමට සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.57 සභාව සතු දැන්වීම් පුවරු 10 ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.58 නගර සභාවට අයත් පෙර පාසල් සඳහා අවශ්‍ය උපකරණ හා සෙල්ලම් භාණ්ඩ මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.59 රු.10000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

- බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීම හා පොදු වැසිකිළි පවිත්‍ර කිරීමට අදාළ ටෙන්ඩර් දැන්වීම් දිනමිණ හා තිනකරන් පුවත්පත්වල පළ කිරීමේ ගාස්තු ලෙස රු.83,430.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.
- පුස්තකාල පොත් මිළදී ගැනීම වෙනුවෙන් එස්.ගොඩගේ ඇන්ඩ් බ්‍රදර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සඳහා රු.103,788.50 ක මුදලක් ගෙවීම.
- පුස්තකාල පොත් මිළදී ගැනීම වෙනුවෙන් එම්.ඩී.ගුණසේන සහ පුද්ගලික සමාගම වෙත රු.97010.00 ක මුදලක් ගෙවීම.
- 56-1906 කෘෘ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඔටෝ සර්විස් ආයතනය වෙත රු.14,385.00 ක මුදලක් ගෙවීම.
- PF - 4006 ඩබල් කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඔටෝ සර්විස් ආයතනය වෙත රු.11,606.25ක මුදලක් ගෙවීම.
- RC-1107 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඔටෝ සර්විස් ආයතනය වෙත රු.18,299.00 ක මුදලක් ගෙවීම.
- ND -5124 වෑන් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ.ඔටෝ සර්විස් ආයතනය වෙත රු.11,990.50 ක මුදලක් ගෙවීම.
- GK -6227 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු.17,920.00 ක මුදලක් ගෙවීම.
- Rc -1118 ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු.16,440.00 ක මුදලක් ගෙවීම.
- ZA 5039 JCB යන්ත්‍රයේ 19.5 24 ප්‍රමාණයේ ටයර් එකක් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් High Way Tyre Service වෙත රු.11,500.00 මුදලක් ගෙවීම.
- බැංකියවත්ත කසළ අංගනයේ සේවකයින් හා පුහුණුවට පැමිණෙන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා අවශ්‍ය බූට්ස් ජෝඩු 10ක් මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. ආයතනය වෙත රු. 22,750.00ක මුදලක් ගෙවීම.
- සුදර්ශනපුර මාර්ගය සඳහා 10mm Melwa කම්බි 62 ක් මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. ආයතනය වෙත රු. 33,480.00ක මුදලක් ගෙවීම.

- බස්නැවතුම්පල වැසිකිළි අලුත්වැඩියාව සඳහා ද්‍රව්‍ය මිළදී ගැනීම වෙනුවෙන් පී.එම්.කේ. ආයතනය වෙත රු. 54,840.00 මුදලක් ගෙවීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.60 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2020.08.10 | සභාපති, සඟබෝ වැඩිහිටි සමිතිය - පල්ලෙකුඹුර මාර්ගයේ පළවන පටුමඟ කාණුවේ ඉතිරි කොටස ඉදි කිරීම. | 02 | 025641 | 284,392.26 |
| | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් - 2020 දෙවන කාර්තුවට අදාළ මුද්දර ගාස්තු ගෙවීම. | 16 | 025649 | 10,590.00 |
| | 2020.07.01 සිට 2020.07.31 දක්වා පොලිතීන් තේරීම සඳහා වැටුප් ගෙවීම | 17-27 | 025650 | 76,700.00 |
| | 2020.07.01 සිට 2020.07.31 කාණු දමීම කසළ ඉවත් කිරීම කම්කරු හා රියදුරු වැටුප් ගෙවීම. | 17-28 | 025650 | 250,900.00 |
| | 2020.07.01 සිට 2020.07.31 දක්වා පොහොර හැලීම හා කසළ තේරීම | 17-29 | 025650 | 249,600.00 |
| | 2020.07.01 සිට 2020.07.31 දක්වා වැසිකිළි නඩත්තුකරුගේ දීමනා ගෙවීම | 17-30 | 025650 | 36,400.00 |
| | 2020.07.01 සිට 2020.07.31 දක්වා කර්මාන්ත අංශයේ කොන්ත්‍රාත් පදනමේ මේසන් හා කම්කරු වැටුප් ගෙවීම. | 17-35 | 025650 | 543,650.00 |
| | හුණුකුඹුර ජලබල එකමුතු සුභසාධක සමිතිය - යූ.ජී.නිශ්ශංක කුමාර මහතාගේ නිවස අසළ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම. | 18 | 025662 | 253,453.06 |
| | හුණුකුඹුර ජලබල එකමුතු සුභසාධක සමිතිය - හුණුකුඹුර ගාලවත්ත සරත් කුමාරසිරි මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීම | 19 | 025663 | 306,616.98 |
| 2020.08.17 | සභාපති, සමගි සුභසාධක සමිතිය - වැලිහරනාව මාර්ගය නඩත්තු කිරීම (03 අදියර) ව්‍යාපෘතියට අදාළ රැඳවුම් මුදල් ගෙවීම. | 24 | 025667 | 174136.46 |
| 2020.08.20 | රෙජිස්ටාර් ජනරාල් - 2019 ජූලි සිට 2019 දෙසැම්බර් දක්වා මුද්දර ගාස්තුවලට අදාළ කාර්ය මණ්ඩල දීමනාව ගෙවීම | 29 | 025681 | 15800.00 |
| 2020.08.21 | Dialog Broadband Networks (Pvt) Ltd – Dialog Cloud අන්තර්ජාල බිල | 32 | 025684 | 11,340.00 |
| | Dialog Broadband Networks (Pvt) Ltd – කාර්යාලයේ දුරකථන බිල් ගෙවීම | 33 | 025684 | 18,511.92 |
| 2020.08.24 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය - 2020 ජූලි, අගෝස්තු ජල බිල් කාර්යාලය, පොදු වෙළෙඳසැල,මහජන පොළ | 38 | 025687 | 30410.61 |
| | 2020 ජූලි මස බස්නැවතුම්පල ජල බිල්පත ගෙවීම | 39 | 025687 | 46,475.76 |
| | සුභසරණ ජ්‍යෝෂ්ඨ පුරවැසි සංවිධානය - | 40 | 025688 | 145,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | කිව්ලේවෙල කොන්ක්‍රීට් පාලමේ ඉතිරි කොටස ඉදිකිරීමට අදාළව ගෙවීම. | | | |
| | සාමාන්‍යාධිකාරී, ලංකා විදුලි බල මණ්ඩලය - 2020 ජූලි මස බස්නැවතුම්පල විදුලි බිල ගෙවීම. | 41 | 025689 | 35,767.13 |
| | සාමාන්‍යාධිකාරී, ලංකා විදුලි බල මණ්ඩලය - 2020 ජූලි, අගෝස්තු මස පොදු වෙළෙඳසැල, මහජන පොළ, මුරකුටිය (පොළ), වැසිකිළිය (පොළ), දොරවෙල ගබඩාව විදුලි බිල් ගෙවීම. | 42 | 025690 | 10,587.90 |
| | සාමාන්‍යාධිකාරී, ලංකා විදුලි බල මණ්ඩලය - 2020 ජූලි, අගෝස්තු කාර්යාලය,නගර සභා යාබද ගොඩනැගිල්ල, හෝරා ස්ථම්භය විදුලි බිල් ගෙවීම. | 43 | 025690 | 14,267.90 |
| 2020.08.26 | එක්සත් සමගි සුභසාධක සමිතිය - මුගුණමලය සෝමා කන්දෙගෙදර මහත්මියගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීම. | 54 | 025725 | 186,000.00 |
| | එක්සත් සමගි සුභසාධක සමිතිය - දොරවෙල සිසිර මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීම | 55 | 025726 | 180,000.00 |
| | සභාපති,ශ්‍රම උදාන සුභසාධක සමිතිය - කිරිඳිගල අනඳමෙත්ගම,රබර්වත්ත සියඹලාගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා මුදල් ගෙවීම. | 59 | 025730 | 500,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.61 RD 8000 ට්‍රැක්ටර් රථයේ පහත සඳහන් අලුත්වැඩියා කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති තෙඹුවන ගරාජ් ආයතනයේ රු.19,850.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ෆෑන් පෙත්ත හා ෆෑන් බෙල්ට් එක, ෆෑන් පුලියේ රේසරය අලුත්වැඩියා කිරීම
- රේඩියේටරය අලුත්වැඩියා කිරීම
- ක්ලච් පද්ධතිය අලුත්වැඩියා කිරීම හා එම ට්‍රැක්ටරයේ ටේලරයේ ජැක් සීල් ගැසීම

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.62 HF-7899 JCB යන්ත්‍රයේ පහත සඳහන් අලුත්වැඩියා සිදු කිරීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති තෙඹුවන ගරාජ් ආයතනයේ රු.39,300.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- පසුපස බකට් එක සෑදීම
- ට්‍රාන්ස්මිෂන් ඔයිල් කාන්දු වන බැවින් පරීක්ෂා කර අලුත්වැඩියා කිරීම

- ඇතුළත රස්නය බැවින් ෆෑන් එකක් සවි කිරීම
- වම් පස හා ඉදිරිපස වීදුරුව අලුත්වැඩියාව
- ග්‍රීස් නොවදින පින් සාදා ගැනීම
- සයිලන්සරය අලුත්වැඩියාව
- පූර්ණ සේවා කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.63 ZA 5039 JCB යන්ත්‍රයේ ඉදිරිපස හා පසුපස බකට්වල දත් අලුතින් දැමීම කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති තෙඹුවන ගරාජ් ආයතනයේ රු.29350.00 ක මිළ ගණන අනුමත කර අදාළ ආයතනයෙන් එම සේවාව ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.64 ZA 5039 JCB යන්ත්‍රය පූර්ණ සේවා කිරීමේදී Avonsmart Engineering Pvt Ltd ආයතනය විසින් දැමිය කළ යුතු යැයි පැවසූ Brake Master Pump Repair Kit 02 ක් දමා අලුත්වැඩියා කිරීම සඳහා ලබා දෙන ලද රු.20,352.87 ක මිළ ගණන අනුමත කර අදාළ සේවාව ඉටු කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.65 HF-7899 JCB යන්ත්‍රයේ පහත සඳහන් අලුත්වැඩියා සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- බැටරියට මේන් ස්විච් එකක් දැමීම
- ආම් එක එසවෙන ජැක් එකට පින් එකක් දැමීම.
- රේඩියේටර් ෆෑන් එක අලුත්වැඩියා කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.66 2020 අයවැය ප්‍රතිපාදන මගින් වෙන්කරන ලද මුදලින් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා රු.299,770.00 ක ඖෂධ මිළදී ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.67 2020-09-26 දින ශ්‍රී ලංකා ප්‍රසංග සම්බන්ධීකරණ, සැණකෙළි උපාංග සම්පාදන කලා හා සංස්කෘතික සංගමය විසින් නගර සභා ක්‍රීඩා පිටියේ පැවැත්වීමට නියමිත සැණකෙළිය විනෝද බදු වලින් නිදහස් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා ඔවුන් විසින් එවා ඇති ලිපිය සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් මෙම සංගීත ප්‍රසංගය වෙනුවෙන් පිට්ටනියට වාහන ඇතුල් කිරීම ආදිය සිදු වන නිසා තම විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් සංගීත ප්‍රසංගය පවත්වනු ලබන ඉහත සංගමය විසින් ක්‍රීඩා පිටිය ලබා දීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලා ලිපියකට අත්සන් ලබා ගත් නමුත් ක්‍රීඩා පිටියට වාහන ඇතුලු කිරීම අවශ්‍ය බව එහි සඳහන්ව නොතිබූ බවද බළන්ගොඩ දරුවන්ට ඇති එකම ක්‍රීඩා පිටිය මෙය වන බැවින් ක්‍රීඩා පිටියෙහි වලවල් කැපීම, වාහන ඇතුල් කිරීම ආදිය සිදු කිරීම පිළිබඳව තමන් විරුද්ධවන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පවසා සිටියේ තමන් ලවා අත්සන් කර ගත් ලිපිය හා අද දින සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිපිය සම්පූර්ණයෙන් වෙනස් බැවින් මෙම කණ්ඩායම සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙසයි.

එමෙන්ම අද දින මෙම කාරණය සභාව වෙත ඉදිරිපත් කිරීම පිළිබඳ ගරු සභාපතිතුමාට විශේෂ ස්තුතියක් ගරු උප සභාපතිතුමා විසින් පුද කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, සභාව විසින් ඇප තැන්පතුව ලබා ගනිමින් අදාළ විනෝද බද්ද අය කර ක්‍රීඩා පිටිය ලබා දීමේ ඇති වැරැද්ද කුමක්දැයි විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙය අනාගත දරුවන්ට ඇති එකම ස්ථානය බැවින් මේ සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, මෙම කණ්ඩායමට වාහන ඇතුල් නොකරන ලෙස කොන්දේසි ඉදිරිපත් කර ක්‍රීඩා පිටිය ලබා දීම සුදුසු බව පවසන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා පවසා සිටියේ මොවුන් විසින් ක්‍රීඩා පිටිය ඇතුළතට වාහන දැමීම අවශ්‍ය බවට පැවසූ බැවින් ඔවුන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම සුදුසු බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා, ක්‍රීඩා පිටිය වරක් සැණකෙළියක් සඳහා ලබා දීමෙන් අනතුරුව එය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවුරුද්දකට වඩා කාලයක් ගත වූ බව ද මේ වන විට ක්‍රීඩා පිටිය බොහෝ දෙනා විසින් භාවිතා කරන බව ද එබැවින් සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට විරුද්ධ නොවන නමුත් වාහන ඇතුල් කිරීම, වලවල් කැපීම ආදිය සඳහා ක්‍රීඩා ගුරුවරයෙක් ලෙස තමන් විරුද්ධ වන බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙහි සංවිධායක මණ්ඩලය විසින් රු.300 ටිකට් 5000 ක් මුද්‍රණය කරන බව ද හට් එක සහිත වාහනය හා සවුන්ඩ් සිස්ටම් එක සහිත වාහන ඇතුල් කරන බව පැවසූ බව ද සඳහන් කළේය. එබැවින් ක්‍රීඩා පිටියේ මුදල, ආරක්ෂණ තැන්පතුව හා විනෝද බද්ද අයකළ යුතු බව පවසන ලදී,

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා ඔවුන්ගෙන් අයවිය යුතු මුදල අය කර, අදාළ කොන්දේසි සමග ලබා දෙන ලෙස පවසන ලදී. එමෙන්ම නගර සභා නිළධාරීන්ගේ අධීක්ෂණය යටතේ ලබා දීම සුදුසු බවත්, වාහන ඇතුල් කිරීමට තමන් විරුද්ධ බවත් පවසන ලදී.

අනතුරුව ක්‍රීඩා පිටිය පහත සඳහන් කොන්දේසි සහිතව ලබා දීම සුදුසු බව සභාවේ මතය විය.

- ✓ වර්ෂාව පැවතුණහොත් සැණකෙළිය පැවැත්වීම තහනම්.
- ✓ ක්‍රීඩා පිටියට වාහන ඇතුල් කිරීම තහනම්.
- ✓ ක්‍රීඩා පිටියට අලාභ හානි සිදුවුවහොත් ගෙවිය යුතුය.
- ✓ ක්‍රීඩා පිටිය වළවල් හෑරීම තහනම්.

එමෙන්ම ඇප තැන්පතුව ලෙස 50,000.00 ක මුදලක්ද විනෝද බද්ද ලෙස රු.150,000.00 ක මුදලක්ද ගෙවිය යුතු බවට තීරණය විය.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.68 දොරවෙල නීලා බලපිටිය මහත්මියගේ නිවස අසළ බැම්ම සකස් කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිරකරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් අදාළ පුද්ගලයින් එහි වැඩ වියදම් පියවා ගන්නා බැවින් අවශ්‍ය ද්‍රව්‍ය පමණක් ඉල්ලා සිටින ලදී.

එබැවින් මේ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය වන 1” කියුබ් 0.25ක්ද, 6”x9” ගල් කියුබ් 4.5 ක්ද, සිමෙන්ති මිටි 23 ක්ද,වැලි කියුබ් 1.75 ක්ද ලබා දීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.69 කාර්යාලීය ස්ථාපිත කර ඇති පහත සඳහන් වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

- ගණකාධිකාරී කාමරය
- මන්ත්‍රී කාමරය
- සභාපතිතුමාගේ කාමරය
- සභා ගර්භය
- රැස්වීම් ශාලාව
- විදුණැන පියස

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිරකරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.70 ආපදා ණය ලබා ගැනීම - ලේකම් - එස්.එච්.ඒ.කරුණාරත්න මිය

සෞඛ්‍ය කම්කරු - මාලනී සිරියලතා මිය

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිරකරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 07.මන්ත්‍රී යෝජනා

### 07.01 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා

07.01.01 කුමාරගම ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය සඳහා පුටු 30ක් ලබා දීම.

07.01.02 බළන්ගොඩ ප්‍රාදේශීය වැඩිහිටි බල මණ්ඩලය සඳහා ප්ලාස්ටික් පුටු 50ක් ලබා දීම.

07.01.03 දුනුමඬලගහවත්ත ප්‍රදේශවාසීන්ගේ සුභසාධක සංගමය සඳහා හට් එකක් ලබා දීම.

07.01.04 කුමාරගම "අනඳමෙත්" ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය සඳහා ප්ලාස්ටික් පුටු 40 ක් ලබා දීම.

07.01.05 ඇල්ලෙපොල සඟබෝ වැඩිහිටි සමිතිය සඳහා ප්ලාස්ටික් පුටු 30 ක් ලබා දීම.

(පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් ඉටු කරනු ලැබේ)

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07.02.01 ලේඩිස්මිත්වත්ත විදුලිබල මණ්ඩලය පාරේ වම් පසට ඇති අතුරු මාර්ගයේ ජල නල එළීම සඳහා මාර්ග උරහිස පලුදු කිරීමේ ගාස්තුවෙන් නිදහස් කිරීම.

07.02.02 දරුවන් පස්දෙනෙකු සමග පැල්පතක ජීවිකාව ගෙවන අසරණ පවුලක් සඳහා නිවසක් ඉදිකර ගැනීමට රු.25000.00 ක් ලබා දීම. (පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන)

07.02.03 තුඹගොඩ මස්සැන්න පාරට හැරෙන මංසන්ධිය අසළ පාර මාරුවීම සඳහා කහ ඉරක් කපා දීමට මාර්ග සංවර්ධන අධිකාරියේ අවධානයට යොමු කිරීම.

07.02.04 දැනට ව්‍යාකුල තත්ත්වයක් ඇති වී තිබෙන ගොඩනැගිලි සැලසුම් සහ බිම් කට්ටි සැලසුම් අනුමත කිරීමේ වැඩපිළිවෙල ගරු සභාවේ සාකච්ඡා කර ඒ සඳහා නිවැරදි ක්‍රමවේදයක් සකස් කිරීම.

07.02.04 බුලත්ගම තලාව ගෙදර මාර්ගයේ ජලනල එළීම සඳහා මාර්ග උරහිස පළුදු කිරීමේ ගාස්තුවෙන් නිදහස් කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉහත සඳහන් මාර්ග, උරහිස පලුදු කිරීමේ ගාස්තුවෙන් නිදහස් කර දෙන ලෙසද 05.02.02 යෝජනාව සඳහා තමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වෙතින් මුදල් වෙන්කරන ලෙසද 05.02.03 යෝජනාව ඉටු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට ඉල්ලීමක් සිදු කරන ලෙසද පවසන ලදී.

ගොඩනැගිලි සැලසුම්පත් හා බිම්කට්ටි අනුමත කිරීමේ ව්‍යාකුල තත්ත්වයක් පවතින අතර මෙම ආයතන දෙක අතර සම්බන්ධයක් නොමැති බවක් බාහිරව පෙනෙන බැවින් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡාවක් සිදු කරන ලෙස පවසන ලදී.

එමෙන්ම ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා අදහස් දක්වමින් නිවාස සැලසුම් අනුමත කිරීමේදී මුල් ඉඩමේ විස්තර ඉල්ලා සිටින බැවින් එම තොරතුරු නොමැති වීම හේතුවෙන් බොහෝ දෙනෙකුට නිවාස සැලසුම් අනුමත කිරීමට නොහැකි වී ඇති බවද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා ගොඩනැගලි සැලසුම්පතක් අනුමත කළ පසු එය සැලසුම පරිදි සකස් කරන්නේද යන්න වැඩ අධිකාරී හා කාර්මික නිළධාරීන් විසින් අධීක්ෂණය කළ යුතු බව පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.03 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

07.03.01 ජනපද මාර්ගයෙන් ප්‍රධාන මාර්ගයට අවතීර්ණ වන ස්ථානයේ පැති කණ්ණාඩියක් සවි කිරීම.

07.03.02 ඕලුගංතොට රෝහල ඉදිරිපිට සිටි පදික වෙළෙඳුන් සඳහා කඩ කාමර සාදා දීම හා ඔවුන්ගෙන් නගර සභාව මඟින් රැගෙන ආ කඩ, අයිතිකරුවන් හට නැවත ලබාදීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ජනපද මාර්ගයෙන් ප්‍රධාන මාර්ගයට අවතීර්ණ වන ස්ථානයේ වංගුවක් පවතින බැවින් පාරේ එන වාහන නොපෙනෙන අතර, ඒ නිසා කණ්ණාඩියක් සවි කර දෙන ලෙසද ඕලුගංතොට රෝහල ඉදිරිපිට පදික වෙළෙඳුන්ගෙන් රැගෙන ආ කඩ කාමර නැවත ලබා දෙන ලෙසද පවසන ලදී

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා බළන්ගොඩ රෝහල් වෛද්‍ය අධිකාරි තුමිය විසින් නිරන්තරයෙන් කළ ඉල්ලීමට අනුව හා පළාත් සභාව මඟින් කළ ඉල්ලීමට අනුව පදික වෙළෙඳුන්ට ඉවත් කරගන්නා ලෙසට දැනුම් දුන්න ද ඔවුන් එය ඉවත් නොකළ බැවින් නගර සභාව විසින් එම ඉවත්කිරීම් කළ බවත් එම ස්ථානයේ පදික වෙළෙඳාම නොකරන ලෙස දැනුවත් කර ආපසු ඔවුන්ට ලබා දුන් බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් කිරිහල පිටුපස කඩ කාමර ජංගම රථ ලෙස සාදා ඉක්මනින් ලබා දෙන ලෙසද දැනට එම ස්ථානයේ එක් ලොතරැයි කුඩුවක් පමණක් පවතින බව ද පවසන ලදී.

මෙයට පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා, එම කඩ කාමරය රජයේ අනුමැතිය ලත් එකක් බව පැවසූ අතර මේ සඳහා වෛද්‍ය අධිකාරි තුමියගේ අනුමැතිය ගෙන පැමිණෙන ලෙස අදාළ අය දැනුවත් කළ බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් සභාවෙන් පදික කඩ සාදා ලබා දෙන තුරු දැනට පවතින සියළුම පදික කඩ ඉවත් කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.04 ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේම කුමාර මැතිතුමා**

07.04.01 බළන්ගොඩ නව නගරයේ ප්‍රධාන මාර්ගයේ සිට දොරවෙල සුනිල් හඳපාන්ගොඩ මහතාගේ නිවසට හා තවත් නිවෙස්වලට යන මාර්ගය නඩත්තු කිරීම කාණුව සහ පැති බැම්ම සකස් කිරීම.

07.04.02 ඉත්තෑගලහේන මාර්ගයේ ජලය ඊට පහළින් ඇති නිවෙස්වලට ගලා යෑම වැළැක්වීම සඳහා කුඩා කොන්ක්‍රීට් බැම්මක් ඉදි කිරීම.

07.04.03 ඉත්තෑගලහේන වසන්ත ෆොන්සේකා මහතාගේ නිවස අසළ පාර නාය යාම නිසා එම ස්ථානයට පැති බැම්මක් ඉදි කිරීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගයේ කොටසක් පමණක් සකස් කර ඇති බැවින් ඉතිරි කොටස නාය යාමකට ලක්ව ඇති අතර එම මාර්ගයේ කාණුව හා පැති බැම්ම සකස් කරන ලෙස පවසන ලදී. එමෙන්ම ඉත්තෑගලහේන වසන්ත ෆොන්සේකා මහතාගේ නිවස අසළ පාර නාය යාම නිසා එම මාර්ගය වැසී ඇති බැවින් එම ස්ථානයේ සිටි ඉහලට මාර්ගයේ ගමන් කළ

නොහැකි වී ඇති අතර එම පස් ඉවත් කර එම ස්ථානයට පැතිබැම්මක් සකස් කර දෙන ලෙසත්, එම මාර්ගයේ වාහන ගමන් කිරීමට නොහැකි වී ඇති බවත් පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.05 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

07.05.01 තම මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඉතිරිව ඇති රු100,000.00 ක මුදලක් යොදවා පුටු ලබා දීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.06 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා**

07.06.01 රාස්සගල පාරේ ෆයිරූස් මහතාගේ නිවාස මාර්ගය ජලය ලබා ගැනීමේදී රු.79,000.00 ක මුදලක් උරහිස පළුදු කිරීම සඳහා ඇස්තමේන්තු කර ඇත. එම මුදල එම ප්‍රදේශවාසීන්ට දැරිය නොහැකි බැවින් එම මුදල ප්‍රදේශවාසීන්ට දැරිය නොහැකි බැවින් එම මුදල නිදහස් කර දෙන ලෙස ඉල්ලමි.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 08. කර්මාන්ත කමිටුව මඟින් නිර්දේශ කරන ලද යෝජනා

**08.01.ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා**

08.01.01 විදුලිබල මණ්ඩලය ඉදිරිපස ලී මඩුව මාර්ගය අලුත්වැඩියා කිරීම හා එම මාර්ගයේ ඉහළ කොටස බැමි බැඳ සඳුන්ගම ඉහළ සිට පැමිණෙන විශාල ජල මාර්ගයට කාණුව සකසා දීම.

08.01.02 සඳුන්ගම හංදියේ ධනසිරි මහතාගේ නිවස මාර්ගය ජනතාවගේ ඉල්ලීම මත ජේසීබී යන්ත්‍රය මඟින් පාර කපා සකසා දීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා සඳුන්ගම මාර්ගයේ ඉහළ සිට පැමිණෙන ජල මාර්ගය සඳහා කාණුවක් සකස් කර දෙන ලෙසද සඳුන්ගම හන්දියේ ධනසිරි මහතාගේ නිවස මාර්ගය සකස් කිරීම සඳහා ජේසීබී යන්ත්‍රය ලබා දෙන ලෙසද පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.02. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමආරච්චි මැතිතුමා**

08.02.01 පසුගිය සභා වාරයේ අංක 04.01.43 යටතේ සම්මත වූ අංක 02 යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී මහජන බැංකුව අසල අඹගහ වටා ඉදිකරන තාප්පය සහ තානායම පාර අසල බිතු කැටයමක් නිර්මාණය කළ තාප්පයේ ඉතිරි කොටස සඳහාත් බිතු කැටයමක්(මියුරල්) නිර්මාණය කර නගරයට අලංකරණයක් එක් කිරීම.

08.02.02 දෙණියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාර සංවර්ධනය කිරීම සඳහා වෙන්කළ ප්‍රතිපාදන මුදලට සිදුකළ හැකි ප්‍රමාණය වැඩ අවසන් කරන ලදි. එම මාර්ගය සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කිරීමට තවත් අඩි 42 ක පමණ ප්‍රමාණයක් කොන්ක්‍රීට් කළ යුතුව ඇත. ඒ සඳහා රු.72,000.00ක පමණ මුදලක් ලබාගැනීම සඳහා අනුමැතිය ලබාගැනීම.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින්, ගරු ජනාධිපතිතුමාගේ පදවි ප්‍රාප්තිය සමඟ චිත්‍ර ඇඳීම සඳහා රටේ විශාල රැල්ලක් ඇති වූ අතර ඒ අනුව ජාතික වියත් පවුර විසින් බළන්ගොඩ තානායම අසළ මාර්ගයේ නොමිලේ මියුරල් සිතුවමක් ඇඳි බව පවසන ලදී. එබැවින් මහජන බැංකුව අඹගහ වටා ඉදිකිරීමට නියමිත තාප්පයේ සහ තානායම පාර අසළ තාප්පයේ ඉතිරි කොටසෙහි බිතු සිතුවම් නිර්මාණය කිරීම සඳහා සාධාරණ මුදලක් ලබා දී බිතු සිතුවම් නිර්මාණය කිරීම වෙනුවෙන් කටයුතු සිදු කරන ලෙසද දෙණියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාර සංවර්ධනය කිරීමේ කර්මාන්තය අවසන් කිරීම සඳහා රු.72,000.00ක පමණ මුදලක් අවශ්‍ය අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දෙන ලෙස ද පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.03. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා**

08.03.01 දුනුමඩලගහවත්ත පාරේ ට්‍රැක්ටර් රථය හැරවීම හේතුවෙන් පළුදු වූ මාර්ගය (පැච් යොදා) නඩත්තු කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.ප්‍රේමදාස මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.04. ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා**

08.04.01 කිරිඳිගල වැලිහරනාව පොල්ගහගොඩ පාර නඩත්තු කිරීම

08.04.02 කිරිඳිගල සේවා පියසේ පිහිටි ග්‍රාම නිළධාරී කාර්යාලයේ වැසිකිලිය ඉදිකිරීමේදී තම යෝජනා යටතේ සිදුකිරීම සඳහා වෙන්කළ ප්‍රතිපාදනවලින් ඉතිරි මුදල වූ රු.97,000.00 ට එම කර්මාන්තය සම්පූර්ණයෙන් සිදුකර ගැනීමට නොහැකි වූ බැවින් ඉතිරි වැඩ ප්‍රමාණය සිදුකර ගැනීම සඳහා රු.800,000.00 ඉක්මවා යන මුදල් අනුමත කර ගැනීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා, අවුරුදු 20 කට පෙර කිරිදිගල වැලිහරනාව පොල්ගහගොඩ මාර්ගය සකස් කළ ද ඉන් පසු කිසිඳු නඩත්තුවක් එම මාර්ගයේ සිදු කර නොමැති බැවින් එම මාර්ගය නඩත්තු කරන ලෙස පවසන ලදී. කිරිදිගල සේවා පියස වැසිකිළිය ඉදි කිරීමට තමන්ගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ඉතිරිවූ රු.97,000.00 ක මුදල යෙදවූ නමුත් එය මේ සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා අවශ්‍ය ඉතිරි මුදල ලබා දෙන ලෙසද එසේ ලබාදිය නොහැකි නම් තමන් සඳහා ලබන වසර සඳහා හිමි මන්ත්‍රී ප්‍රතිපාදන මේ වසරේ මෙම කර්මාන්තය සඳහා අවශ්‍ය ඉතිරි මුදල ලබා දෙන ලෙසද පවසන ලදී. මෙය සමාජ කටයුත්තක් මෙන්ම සෞඛ්‍ය කටයුත්තක් බැවින් මේ සඳහා අනුමැතිය ලබා දෙන ලෙස වැඩිදුරටත් සඳහන් කරන ලදී,

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.05.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

08.05.01 බළන්ගොඩ පෙට්ටිගල ප්‍රධාන මාර්ගයේ දෙවට පාර අතුරු මාර්ගයට පිවිසෙන ස්ථානයේ පාලම පුළුල් කර ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම.

08.05.02 බළන්ගොඩ පෙට්ටිගල මාර්ගයේ නගර සභාව කොටස තුළ අනාරක්ෂිත වංගු සහිත ස්ථාන සඳහා මාර්ග සංඥා පුවරු සවිකර අනතුරු අවම කරගැනීමට කටයුතු කිරීම.

08.05.03 කොටුගොඩැල්ල සිට බෝම්බුව දක්වා දිවෙන කෙටිම මාර්ගය වන දෙහිපිටිය නිවස අසලින් යොමුවන මාර්ගය සඳහා කුඩා ප්‍රමාණයේ පාලමක් ලබාදීමට කටයුතු කිරීම.

08.05.04 ගල්වල, බෝම්බුව මාර්ගයේ අනාරක්ෂිත ස්ථාන සඳහා වීථි ලාම්පු කිහිපයක් ලබාදිම.

08.05.05 සිරිල් මහත්මලාගේ ගෙවල් පාර පූජාපිටිය මාර්ගය ලෙස නම් කිරීම. (මෙම නම අතීතයේ සිට මේ දක්වා භාවිතා වන නමකි)

08.05.06 පී.එම්.එල්.සිල්වා මහතාගේ ඉල්ලීම් ලිපියට අදාළව එම මහතාගේ නිවස අසල කාණුව සකස් කර දීම.

08.05.07 හැමිල්ටන් මහතාගේ නිවස අසල මාර්ගයේ කාණුව ආවරණය සඳහා කොන්ක්‍රීට් ප්ලේට් යෙදීම.

08.05.08 කිරිදිගල මැද පාර( බුද්ධ ජයන්ති පාර) සුද්ධ කර දීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා තමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා කඩිනමින් ඉටු කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.06.ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

08.06.01 බළන්ගොඩ මූලික රෝහල වෙත කොම්පෝස්ට් පොහොර ට්‍රැක්ටරයක් පරිත්‍යාග කිරීම.

08.06.02 නව පොළ භූමියේ ඇති වැසිකිලිය අඩුපාඩු නිමකොට සංවර්ධනය කිරීම.

08.06.03 නව පොළ භූමියේ මාළු වෙළෙඳසැලවල් අසල කාණුව ක්‍රමවත් කිරීම සහ කාණුව වසා කොන්ක්‍රීට් තහඩු යෙදීම.

08.06.04 නව පොළ භූමිය අසල ක්‍රීඩාංගනයට මැදිව පවතින මහජනතාවට පාවිච්චි කළ හැකි වාහන නැවතුම්පොළ ක්‍රමවත්ව වැසිජලය නොරැක්ෂෙන සේ සකස් කරදීම.

08.06.05 ක්‍රීඩාපිටිය සහ ගඟට මැදිව ඇති ඉවත් නොකළ පස් ඉවත් කරදීම සහ මාර්ගය බස් නැවතුම දක්වා සෑදීම.

08.06.06 සේනක පෙදෙසේ මාර්ගය පළල් ස්ථානයේ වැඩිපුර ඇති පස් ඉවත් කරදීම.

08.06.07 එම ස්ථානය අසලම බිම දමා ඇති පරණ විදුලි කණුව ඉවත් කර එම ප්‍රදේශය සුද්ධ කිරීමට බැකෝ යන්ත්‍රය ලබාදීම.

08.06.08 එම ස්ථානයේ අඩි 02 ක් උස අඩි 15ක් දිග බැම්මක් සාදා දීම.

08.06.08 එම ස්ථානයේ මන්ත්‍රී ප්‍රතිපාදන මඟින් තැනීමට අදහස් කරන මාර්ගය අසල භූමිය මට්ටම් කිරීමට සුළු කාලයකට බැකෝ යන්ත්‍රය ලබාදීම.

08.06.09 කුමාර විද්‍යාලය අසල මාර්ගයේ කොන්ක්‍රීට් තහඩු යෙදූ ස්ථානයේ තවත් ඉතිරි කොටස් කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීම.

08.06.10 ශ්‍රී වීරසුන්දරාරාමයට හැරෙන හංදියේ ඇති කාණුව වැසෙන සේ කොන්ක්‍රීට් තහඩු යෙදීම.

ඉහත යෝජනා ගරර නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ මූලික රෝහලේ වගාවන් සිදු කරන අතර ඒ සඳහා අවශ්‍ය කොම්පෝස්ට් පොහොර ලබා දෙන ලෙසද අනෙකුත් යෝජනා සියල්ල හැකි ඉක්මනින් ඉටු කරන ලෙසද පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.07.ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලික්ෂා මැතිතුමා**

08.07.01 ගොරොක්ගහමඩ දුනුමඩලගහවත්ත මාර්ගය අබලන් වී ඇති කොටස අළුත්වැඩියා කිරීම.

08.07.02 ෆලීල් හාජ්ජියාර් මාවත වතුර ටැංකිය පාර අබලන් වී ඇති කොටස අළුත්වැඩියා කිරීම.

08.07.03 ගොරොක්ගහමඩ බෙතල්හිල් මාවත උඩ කොටස මාර්ගයට කඩා වැටී ඇති පස් ඉවත් කිරීම.

08.07.04 එෆ්.එච්.මාවත උඩ කොටස සිට මුස්තාෆා මාවත දක්වා මාර්ලය ජේ.සී.බී.යන්ත්‍රය යොදා මාර්ගය සකස් කිරීම.

08.07.05 මිරිස්වත්ත කහටපිටිය මාර්ගයේ සුබයිර් අලීම් මාවත කඩිනමින් අළුත්වැඩියා කිරීම.

ඉහත යෝජනා ගරර නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින්ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් තමන් විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් මාර්ග අලුත්වැඩියා කඩිනමින් ඉටු කරන ලෙසද 08.07.04 යෝජනාව සඳහා ජේ.සී.බී.යන්ත්‍රය යොදන ලෙසද පවසන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.08.ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා**

08.08.01 මහජන පොළේ වැසිකිලිය අළුත්වැඩියා කිරීම.

08.08.02 බළන්ගොඩ නගර සභාවට වතුර මෝටරයක් මිලට ගැනීම.

08.08.03 කර්මාන්ත සිදුකිරීම සඳහා අවශ්‍ය පරිදි රෝලක් මිලදී ගැනීම.

ඉහත සඳහන් යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.09.ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

08.09.01 තුඹගොඩ ජයන්ති පාර 1 පටුමඟ කාණුව වැසී ගොස් ඇති බැවින් එය පිළිසකර කිරීම.

08.09.02 කරවිකැටිය ලාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාගේ නිවස ඉදිරිපිට කාණුවේ වතුර බැස නොයාම නිසා ඩෙංගු උවදුර ඇතිවිය හැකි බැවින් ඒ සඳහා පිළියම් යෙදීම.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය නව වැඩ අධිකාරීතුමාට සුභ පැතුම් එක්කල අතර මෙවර පාර්ලිමේන්තුව සඳහා තේරී පත්වූ තලතා අතුකෝරළ මැතිතුමිය, අකිල එල්ලාවල මැතිතුමා සහ ගාමිණී වලේබොඩ මැතිතුමා වෙත සුභ පැතුම් පුදකරන ලදී. උඩකන්ද පාර කොන්ක්‍රීට් ස්ලැබ් දැමීමේ කර්මාන්තයේ ස්ලැබ් අක්‍රමවත් බවට ආණ්ඩුකාරතුමා වෙත පෙත්සමක් ඉදිරිපත් කර ඇති අතර එම පෙත්සම මගින් පෙන්වා දී ඇති කොන්ක්‍රීට් පියන තමන් විසින් දැමූ කර්මාන්තයක් නොවන බව ද මෙමගින් සභාවේ නිළධාරීන් අපහසුතාවයට ලක්වූ බැවින් මෙවැනි පහත් වැඩ කිරීමෙන් වලකින ලෙස ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද විමලසිරි මැතිතුමා පවසා සිටියේ මෙම පෙත්සම මගින් පෙන්වා දී ඇති කොන්ක්‍රීට් ස්ලැබ් කැබැල්ල නිවසකට යාම සඳහා දමා ඇති කොන්ක්‍රීට් කැබැල්ලක් බව තමා කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලෙස වගකීමෙන් පවසන බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා පවසා සිටියේ වසර එක හමාරකට පසු මෙම මුදල ඉල්ලූ අතර මෙහි වැඩ වටිනාකම ගෙවීම සුදුසු බවයි.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටිය් මෙම පෙත්සම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන බැවින් එම පරීක්ෂණය අවසන් වූ වහාම එම මුදල් ගෙවිය හැකි බවයි.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.10.ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

08.10.01 සුදර්ශනගම ඉහළ මාර්ගයේ එන්.සුනේත්‍රා මහත්මියගේ නිවස අසල සිට පහළ සුනිල් වීරසිංහ මහතාගේ නිවස දක්වා වූ මාර්ගය ඉතාම අබලන් වී ඇති බැවින් එය සංවර්ධනය කරදෙන මෙන් ඉල්ලා සිටීම.

08.10.02 හුණුකුඹුරගම මාර්ගයේ ජලනල එලීමේදී මාර්ගය පළුදුවීම නිසා එය නැවත සකස් කිරීමේදී නිසියාකාරව සිදු නොකිරීම නිසා එම මාර්ගයේ දයානන්ද බිනරගම මහතාගේ නිවස අසල සිට වසන්ත මහතාගේ නිවස දක්වා අබලන් වී ඇති බැවින් මෙය ප්‍රතිසංස්කරණය කරදීම.

08.10.01 යෝජනාව ඉක්මනින් ඉටු කරන ලෙසද 08.10.02 නිසියාකාරව සිදු කර නොමැති අතර 200m ක් පමණ ඇති එම මාර්ගය සංවර්ධනය කරන ලෙස ද පවසන ලදී. එමෙන්ම තම මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ රු.240,000.00 ක මුදලක් සුනිල් ගරාජය අසළ පැති බැම්ම සකස් කිරීම සඳහා සම්මත කර ගත් අතර එය පාර සකස් කිරීම සඳහා යොදවන බව පවසන ලදී. එමෙන්ම ගිය සභාවාරයේදී හුණුකුඹුර රොෂාන් කැලිස්ටන් මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා JCB යන්ත්‍රය ඉල්ලූ නමුත් මේ වන තෙක් එය නොලබුණු බැවින් එය ලබා දෙන ලෙස පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.11 ලිපි මඟින් ලැබෙන යෝජනා**

08.11.01 බළන්ගොඩ , කිරිදිගල,අනඳමෙත්ගම අංක 75/10ඒ ලිපිනයෙහි පදිංචි එම්.ආර්.ජානක ප්‍රියන්ත මහතා කළ ඉල්ලීමට අනුව අනඳමෙත්ගම සියඹලාගහවත්ත මාර්ගයේ කාණු පද්ධතියේ ඩෙංගු මදුරුවන් බෝවීම පාලනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | **6,221,910.45** |
| වෙනත් ලැබීම් | **7,467,617.97** |
| මුලු ලැබීම් | **13,689,528.42** |
| පුනරාවර්තන වියදම් | **8,777,345.58** |
| වෙනත් වියදම් | **5,452,343.33** |
| මුලු වියදම් | **14,229,688.91** |

**2020-08-01 දින සිට 2020-08-31 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 24,232.00 |
| 227-5020 | 59,316.00 |
| RD - 8240 | 27,352.00 |
| BC-0005 | 20,800.00 |
| GC 0001 | 6,720.00 |
| 226-7521 | 13,090.00 |
| RC 8183 | 41,600.00 |
| LL - 7688 | 6,864.00 |
| HF - 8558 | 15,098.00 |
| GK-6227 | 13,556.00 |
| JD-4684 | 2,740.00 |
| 1 | 33,984.00 |
| ND-5124 | 25,064.00 |
| PF-4006 | 23,892.00 |
| QL-2901 | 5,754.00 |
| 37-7933 | 4,472.00 |
| RC-1107 | 17,435.00 |
| RC 1118 | 36,400.00 |
| DDR 0008 | 2,496.00 |
| SDRR0013 | 18,950.00 |
| UQ - 1933 | 4,110.00 |
| VI 1833 | 1,096.00 |
| HF 7899 | 37,160.00 |
| | 1,590.00 |
| | 10,800.00 |
| CSM 009 | 493.20 |
| CwM | 548.00 |
| MG 0014 | 22,880.00 |
| ZA 5039 | 35,449.04 |
| YG-0758 | 2,055.00 |
| **එකතුව** | **515,996.24** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. ඇස්තමේන්තු අනුමත කිරීම.**

**10.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

10.01.01 උඩ ඇල්ලෙපොල මහමෙව්නා මාවතේ දෙවන අතුරු මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම. - රු.159,000.00

10.01.02 කරවිකැටිය මහමෙව්නා මාවතේ දෙවන අතුරු මාර්ගය තාර යොදා සංවර්ධනය කිරීම. රු.350,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10.02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

10.02.01 දෙණියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාර ඉතිරි කොටස සංවර්ධනය කිරීම. - රු.75,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් පසුගිය අධික නියගය පැවති අවස්ථාවේදී මෙම සභාවේ ජල බවුසරය ලබා දීම පිළිබඳ ගරු සභාපතිතුමාට ගෞරවනීය ස්තුතිය පුද කරන ලදී. එමෙන්ම අද දින ගරු සභාව අවසන් වන තුරුම මන්ත්‍රී මණ්ඩලය රඳී සිටින ලද අතර ඒ පිළිබඳව තමන් සතුටු වන බව පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා පුරණගෙදර පාරට හැරෙන හන්දියේ පැවති "බළන්ගොඩ" නාම පුවරුව සකස් කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් තලාව පන්සල දක්වා මාර්ගය සකස් කර ගැනීම සඳහා රෝල ලබා දෙන ලෙස ද බළන්ගොඩ ඉරිදා පොළේ පළතුරු වෙළෙන්ඳන්ගෙන් කිහිපදෙනෙක් පළතුරු සඳහා රසායනික ද්‍රව්‍ය මුසු කර ඇති බවට තොරතුරු ලැබීමෙන් අනතුරුව එය ආවරණය කිරීමට ගිය මාධ්‍යවේදීන්ට තර්ජනය කර ඇති බව ද මේ පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් සොයා බලා අවශ්‍ය නීතීමය ක්‍රියාමාර්ග ලබා ගන්නා ලෙස ද පවසන ලදී. පරිභෝජනයට නුසුදුසු කරවල හාල්මැස්සන් අඩු මිළකට විකුණන බැවින් මේ පිළිබඳව ද සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් දැනුවත් කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ කුමාර විද්‍යාලයට මේ වන විට සුවිශේෂී තැනක් හිමිව පවතින නමුත් 3 වන ශ්‍රේණිය සඳහා ඉංග්‍රීසි ගුරුවරයෙක් නොමැති බවට පුවත්පතක පළ කර තිබූ අතර ඒ පිළිබඳ අදාළ ආයතන දැනුවත් කරන ලෙසද පසුගිය නියඟය කාලයේදී තම ගම්වාසීන්ට ජලය නොමැති වූ අවස්ථාවේදී සභාව මඟින් අවශ්‍ය මොහොතේදීම ජල බවුසරය ලබා දුන් අතර ඒ පිළිබඳව ස්තූතිය පුද කරන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

නව වැඩ අධිකාරී මහතා හා කාර්මික නිළධාරි මහතා වෙත සුභ පැතුම් එක් කරමින් තම අදහස් දැක්වීම ආරම්භ කරන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා ටෙලිකොම් වලවල් වල පියන ගෙවී ඇති බැවින් බොහෝ වාහන අනතුරුවලට ලක්වන බව ද ඒ සම්බන්ධව එම ආයතනය දැනුවත් කර ඉල්ලීමක් සිදුකරන ලෙස ද පැවසූ අතර ශාඛා පුස්තකාල සකස් කිරීමේ වර්තමාන ප්‍රගතිය කුමක්දැයි විමසන ලදී. එමෙන්ම ලංකා බැංකුව ඉදිරිපිට කඩපේළයේ වහළ තණකොළ වලින් වැසී ඇති බැවින් සුද්ධ පවිත්‍ර කරන ලෙසද නගරයේ කොන්ක්‍රීට් ලැලි ශුද්ධ කර දැමීමේදී නිසි ලෙස සකස් නොකරන බැවින් එය නිසි ලෙස සකස් කරන ලෙස අදාළ ආයතන දැනුවත් කරන ලෙසද සංගීත ප්‍රසංගය පැවැත්වීම සම්බන්ධයෙන් අදාළ පුද්ගලයින් සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙසද පවසන ලදී.වැඩිදුටරත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා පාපන්දු ක්‍රීඩා පිට්ට සඳහා දැල් දෙකක් ලබා දෙන ලෙසද කේ.ඒ.ඔටෝ ආයතනයේ පවතින අපද්‍රව්‍ය, මුදලක් අය කර හෝ ලබා ගන්නා ලෙසට පැවසූ බව ද සඳහන් කළේය.

**ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් නව වැඩ අධිකාරී මහතා වෙත සුභ පැතුම් එක් කරන ලදී

**ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

2021 වර්ෂය සඳහා ගැසට් කරන සේවාවන් වල ගාස්තු සංශෝධනය කිරීම සුදුසු බවද නියෝජ්‍ය නායක සජිත් ප්‍රේමදාස මැතිතුමා එක්සත් ජාතික පක්ෂය කැඩීමට තැත් කළ නමුත් එය කිරීමට නොහැකි වූ අතර ගරු ජනාධිපතිතුමාටත් අගමැතිතුමාටත් තමන් ගරු කරන බව ද ඔවුන්ට මෙම රට සෑදීම සඳහා අවසාන අවස්ථාව ලැබී අති බවද පවසන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණට 2/3 බලට ලබා ගැනීම සඳහා සමගි ජන බලවේගය උදව් කළ අතර සජිත් පේමදාස මහතා ඉවසීමෙන් එක්සත් ජාතික පක්ෂය හා එක්ව ඉදිරියට ගියේ නම් පාර්මේන්තු ආසන 85ක් පමණ ලබා ගත හැකිව තිබූ බවද රුවන් විජේවර්ධන මැතිතුමාගේ නායකත්වය හා සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වයෙන් එකට එකතු වී ඉදිරියට ගියහොත් තම පක්ෂයට ජයග්‍රහණය කළ හැකි බවද ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ යහපත් ක්‍රියාවන්වලට එකඟ වන බවද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා පැවසූ පරිදි සජිත් ප්‍රේමදාස මැතිතුමා හා රනිල් වික්‍රමසිංහ මැතිතුමා මෙන් මෙම සභාව බෙදීමක් ඇති නොකරන ලෙසද සජිත් මැතිතුමා හා රනිල් මැතිතුමා මෙම සභාවට ගෙන ඒමේ අවශ්‍යතාවයක් නොමැති අතර ගම්පෙරළිය යටතේ මුදල් ලබා දුන් බැවින් කිසි දෙයක් ලබා දුන්නේ නැති බව කීම වැරදි බවද අපිට නායකයෝ කවුරුත් එක සමාන බවද මිනිසුන්ට අපි ගරු කළ යුතු අතර එවිට අපටත් ගරු ලෙස කථා කරන බව ද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් නව වැඩ අධිකාරිතුමාට සුභ පැතුම් එක්කළ අතර පෙර පාසල් පාලිකා තනතුරේ සේවය කරන නිළධාරිණිය ගරු ආණ්ඩුකාරතුමාගේ චක්‍රලේඛය පරිදි ස්ථිර කිරීම බලාපොරොත්තු විය නොහැකි බැවින් ඇයට කම්කරු ලෙස දෛනික පදනම මත හෝ දීමනාවක් ලබා දෙන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් හුණුකුඹුර කෝපිවත්ත මාර්ග හන්දියේ කුණු කසළ දමන බැවින් එම ස්ථානයේ ඇති සී සි ටීවී කැමරා පරීක්ෂා කර බලන ලෙසද පීරිස් මහතාගේ නඩු තීන්දුව ලබාදුන් අතර ඒ පිළිබඳව සතුටු වන බවද පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් සභාවේ කාලය කළමණාකරණය කර කටයුතු සිදු කරන ලෙසද අද දින මන්ත්‍රීවරුන්ගේ යෝජනා 59ක් පමණ පවතින නමුත් ප්‍රායෝගික නොවන දේවල් වලින් න්‍යාය පත්‍රය පිරවීම තේරුමක් නොමැති බව ද අද දින කුණු කසළ ටෙන්ඩරය පිළිබඳ පැණ නැගුණ ගැටලුවේදී සභාව හා නිළධාරීන් අපහසුතාවයට පත්වුණ අතර මීට පසුව හෝ මෙවැනි දෙයක් සිදු නොවීමට වග බලා ගන්නා ලෙසද පවසන ලදී.

එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය වෙනස් කර ගැනීම සුදුසු වන නමුත් ජනතාව විසින් රජය වෙත 2/3 ක බලය ලබාදුන්නේ ජනාධිපති අගමැති හා ආණ්ඩුවට හිතෙන පරිදි කටයුතු කිරීමට නොව ජාතික ආරක්ෂාව හා ජාතික සමඟිය ඇති වන ලෙස කටයුතු කිරීමට වන බව ද 19 වන සංශෝධනයේ පවතින යහපත් ලක්ෂණ ඉවත් නොකළ යුතු බව තම පෞද්ගලික මතය බව ද පවසන ලදී.

**12. අවසානය**

අද දින සභාවේ සිදු වූ අඩුපාඩු නිසා අත්දැකීම් ලබා ගත් අතර සභාව වෙත ඇති මුදල් ප්‍රතිපාදන මන්ත්‍රීවරුන්ගේ යෝජනා වලට ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බවත් නව වැඩ අධිකාරිතුමා හා කාර්මික නිළධාරීතුමාගේ කාර්යක්ෂමතාවය අනුව එම කටයුතු කිරීමට බලාපොරොත්තු වන අතර අද දින සභාව සඳහා සහභාගි වූ සියලු දෙනාට ස්තුතිය පුද කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ප.ව 6.00 ට සභාවේ කටයුතු අවසන් විය.

චමික ජයමිණි විමලසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.